# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,929 — 1970 ඔක්තෝබර් 23 වැනි සිකුරාද — 1970.10.23

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිඩ කරන ලදි.)

# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනුකර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| පළාත් පාලන නිවේදන ... ... ... | 725 | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... | 730 |
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 727 | අය-වැය ලේඛන ... ... ... | 732 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — | දේපල විකිණීම ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | 729 | මාර්ග කොමිටි දැන්වීම ... ... ... | — |
| පළාත් පාලන සභා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | 730 | විවිධ දැන්වීම ... ... ... ... | 734 |


## පළාත් පාලන නිවේදන

**සැලකිය යුතුයි.**—මෙවර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් පත්‍රයේ VI වැනි කොටසේ ජූරි සභිකයන්ගේ සහ උපදේශකවරුන්ගේ නාමලේඛනයක් පළවේ.

එල්. ඩී.—බී. 69/41

### ගම්සභා ආඥාපනත

(257 වන අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37 වන වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමති ෆිලික්ස් රෙජිනෝල්ඩ් ඩයස් බණ්ඩාරනායක වන මම, අරාලි ගම් ප්‍රදේශය සම්බන්ධයෙන් එකී වගන්තිය යටතේ ඉඩම් බද්දක් පනවා අයකර ගැනීමට යාපනය දිස්ත්‍රික්කයේ අරාලි ගම් සභාවට මේ නිවේදනයෙන් බලය පවරමි.

ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු ඇමති.

1970 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දී ය.

10–905—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

### ගම්සභා ආඥාපනත

#### 13 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥා පනතේ 13 (1) වගන්තියෙන් මා වෙත පැවරුනු බලතල ප්‍රකාර මොණරාගල දිස්ත්‍රික්කයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, හත්තොටුව ගමගේ ආනන්ද වන මම, මොණරාගල දිස්ත්‍රික්කයේ, දඹගල්ල ගම්සභාවේ, අංක 4 දරණ කොට්ඨාශයේ සභික සෝනාර මුදියන්සේලාගේ බේබිමහත්මයා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට තමන් තෝරාපත් කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව, මොණරාගල දිස්ත්‍රික්කයේ, දඹගල්ල ගම්සභාවේ, අංක 4 දරණ කොට්ඨාශයේ සභික සෝනාර මුදියන්සේලාගේ බේබිමහත්මයා මහතා මෙම දැන්වීම ගැසට්පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

එච්. ජී. ආනන්ද,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මොණරාගල දිස්ත්‍රික්කය.

1970. 10. 11 වැනි දින,
පළාත් පාලන දෙපාර්තමේන්තුවේ
මොණරාගල කාර්යාලයේ දී ය.

10–883—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

**සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ**

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1970 ජූනි මස 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

ඇල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

## ගම්සභා ආඥාපනත

### 13 වැනි ඡේදය යටතේ කරන දැන්වීමයි

(257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥාපනතේ 13 (1) වැනි වගන්තියෙන් මාවෙත පැවරෙන බලතල ප්‍රකාර, මාතර පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්, විතානවසම් කීර්ති චන්ද්‍ර නානායක්කාර වන මම, මාතර දිස්ත්‍රික්කයේ බෙරලපනාතර ගම්සභාවේ අංක 12 දරණ ගම්සභා නියෝජිත කොට්ඨාශයෙහි සභික වණිගසේකර වෙල්ලප්පුලිගේ දොන් සියදෝරිස් මහත්මයා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කර ගැනීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමට පත්ව, මාතර දිස්ත්‍රික්කයේ, බෙරලපනාතර ගම්සභාවේ, අංක 12 දරණ නියෝජිත කොට්ඨාශයෙහි සභික වණිගසේකර වෙල්ලප්පුලිගේ දොන් සියදෝරිස් මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව, මෙයින් ප්‍රකාශ කරමි.

විතානවසම් කීර්තිචන්ද්‍ර නානායක්කාර,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
මාතර දිස්ත්‍රික්කය.

1970 ඔක්තෝබර් මස 11 වැනි දින,
මාතර, පළාත් පාලන කාර්‍යාලයේ දී ය.

10-884—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### කළුතර දිස්ත්‍රික්කයේ වාද්දූ වස්කඩුබද්ද ගම්සභාව බෙද නව ගම්සභා දෙකක් සංස්ථාපනය කිරීම

(අ) යෝජිත ගම්සභා දෙකේ සීමා විස්තර,

(ආ) යෝජිත ගම්සභා දෙක සමන්විත විය යුතු ඡන්ද කොට්ඨාශ සංඛ්‍යාව,

(ඇ) වාද්දූ වස්කඩුබද්ද ගම්සභාව බෙදා නව ගම්සභා දෙකක් සංස්ථාපනය කිරීමේදී සභිකයකු නියෝජනය කරන එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාව හැකිතාක් දුරට සමානවනසේ ප්‍රදේශයේ විශාලත්වය, ජනගහනය හා වෙනත් හේතු සාධකද සලකා, එක් එක් ගම්සභාවේ සීමා විස්තර සහ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවල විස්තර,

සම්බන්ධ කරුණු ගැන පරීක්ෂා කොට වාර්තා කිරීම සඳහා නිල කමිටුවක් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් පත්කර ඇති වග මහජනයා වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මේ සම්බන්ධයෙන් සැළකිල්ලක් දක්වන යම් පුද්ගලයන් හෝ සංවිධානයන් වෙතොත් ස්වකීය අදහස් කළුතර සහකාර පළාත් පාලන කොමසාරිස්වරයා වෙත 1970.11.14 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ ලියවිල්ලක මාර්ගයෙන් දැනුම් දිය යුතුය.

මේ ලියවිලි පිටපත් තුනකින් යුතුව ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු බව කරුණාවෙන් සළකන්න.

ලලිත් හෙට්ටිආරච්චි,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
කළුතර.

1970 ඔක්තෝබර් මස 11 වැනි දින,
කළුතර, පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්‍යාලයේ දීය.

10-888—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : සී 14/බ/1

## ගම්සභා ආඥාපනත

### 13 වන වගන්තිය යටතේ දැන්වීම

(257 වැනි අධිකාරය) ගම්සභා ආඥාපනතේ 13 (1) වගන්තියෙන් මා වෙත පැවරුන බලතල ප්‍රකාර, ගාල්ල පළාත් පාලන දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්, වික්‍රමරත්න කොඩිප්පිලි ආරච්චි පටබැඳිගේ පර්සි අබේසිංහ වන මම ගාළු දිස්ත්‍රික්කයේ බටපොල ගම්සභාවෙහි අංක 2 දරණ කොටසේ සභික උතත්මාවඩු නාන්දිරිස් ද සිල්වා මහතා සභාවට දැන්වීමක් නොමැතිව පිළිවෙලින් සභාවේ රැස්වීම් වාර තුනකට වැඩි ගණනකට, තමන් තෝරා පත්කරගනු ලැබීමෙන් පසු නොපැමිණි බව ගැන සෑහීමකට පත්ව ගාළු දිස්ත්‍රික්කයේ බටපොල ගම්සභාවෙහි අංක 2 දරණ කොට්ඨාශයෙහි සභික උත්තමාවඩු නාන්දිරිස් ද සිල්වා මහතා මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළකිරීමේ දින සිට තම සභිකත්වය අත්හරින ලද බව මෙයින් ප්‍රකාශ කරමි.

ඩබ්ලිව්. කේ. ඒ. පී. පී අබේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
ගාල්ල.

1970.10.8 දින,
ගාල්ලේ පළාත් පාලන අමාත්‍යාංශ කාර්යාලයේ දීය.

10-684—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී—බී. 69/41

## ගම්සභා ආඥාපනත

(257 වැනි අධිකාරය වන) ගම්සභා ආඥාපනතේ 37(2) වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති.

1970.10.10 දින,
කොළඹදී ය.

### ආඥාව

කොළඹ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරළයේ යටිගහපත්තුවේ කොටදෙණියාව ගම්සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශය, ගම් සභා ආඥාපනතේ 37 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ තුන්වැනි අතුරු විධානයේ සඳහන් අක්කර බද්ද ඒ වගන්තිය යටතේ පනවා අය කිරීමේ කාර්‍යය සඳහා විශේෂ ප්‍රදේශයක් වශයෙන් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

10-906—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

ඇල්.ඩී—බී. 16/70

## ගම්සභා ආඥාපනත

කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් සම්මත කර ඇති (257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥා පනතේ 40අ හා 40ආ යන වගන්ති යටතේ වූ පහත සඳහන් යෝජනාව ඒ ආඥාපනතේ 46 වැනි වගන්තිය යටතේ මුදල් ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමතකර ඇති බැව් මහජනයාගේ දැනගැනීම සඳහා මෙයින් නිවේදනය කරනු ලැබේ.

පී. සිරිවර්ධන,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා සවදේශ කටයුතු අමාත්‍යාංශයේ සථිර ලේකම්.

1970 සැප්තැම්බර් මස 9 දින,
කොළඹ දීය,

### යෝජනාව

මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය තුළ පිහිටි සියළුම ගොඩනැගිලිවල සහ ඉඩම්වල වාර්ෂික වටිනාකමින් සියයට තුනක් වූ ජල බද්දක් 1971 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන පරිදි සමාන කොටස් හතරකින් එක් එක් වර්ෂයේ මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 යන දිනවලදී හෝ එම දිනයන්ට ප්‍රථම ගෙවිය යුතු වන පරිද්දෙන් එකී ප්‍රදේශය තුළ පනවා අය කිරීමට (257 වැනි අධිකාරිය වන) ගම්සභා ආඥාපනතේ 40 (අ) සහ 40 (ආ) දරන වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ නිකවැරටිය ගම් ප්‍රදේශයේ ගම්සභාව විසින් මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

### උපලේඛනය

ජල බෙදාහැරීමේ ජල කණු පිහිටා තිබෙන ජල සම්පාදන යෝජනා ක්‍රමයේ ජල නළ මාර්ගවල දෙපැත්තේ අඩි 250 ක දුරක් ඇතුළත පිහිටියා වූ මුළු ප්‍රදේශය.

10-924—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## පළාත් පාලන දෙපාර්තමේන්තුව

### කැකිරාව සුළු නගර සභාවේ සීමා දීර්ඝ කිරීම

ගරු රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා විසින්, පහත සඳහන් අයගෙන් සමන්විත නිල කමිටුවක් :—

(1) අනුරාධපුර කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, කේ. ඒ. කරුණාරත්න මහතා.

(2) උතුරු කලා ගම් පළාත, ඉපලෝගම ප්‍රා. ආ. නිලධාරි, ඩබ්ලිව්. තෙන්නකෝන් මහතා.

(3) කැකිරාව මැනුම් කඳවුර, මැනුම් කණ්ඩායම භාර නිලධාරි, එස්. කැකුලන්දර මහතා.

පහත සඳහන් කරුණු පරීක්ෂාකර බලා වාර්තා කිරීම පිණිස පත්කර ඇති බැව් මෙයින් නිවේදනය කරමි :—

(අ) දැනට කැකිරාව සුළු නගර සභා සීමා වලින් පිටස්තරව ඇති, යම්කිසි ප්‍රදේශයක් එම සුළු නගර සභා සීමාව තුළට ඒකාබද්ධ කළ යුතුද,

(ආ) සභිකයකු නියෝජනය කරණ එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාව හැකිතාක් දුරට සමාන වනසේ, ප්‍රදේශයේ විශාලත්වය, ජනගහනය හා වෙනත් හේතු සාධකද සලකා බලා කැකිරාව සුළු නගර සභාව සමන්විත වියයුතු සභික සංඛ්‍යාව,

(ඇ) සුළු නගර සභාවේ සීමාවල විස්තර සහ,

(ඈ) සුළු නගර සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවල විස්තර සම්බන්ධ කරුණු ගැන පරීක්ෂාකොට සීමා නිශ්චය කිරීම.

මේ සම්බන්ධයෙන්, නියෝජනයන් ඉදිරිපත් කිරීමට කැමති සංවිධාන හා මහජනයා 1970 ඔක්තෝබර් මස 31 දිනට පෙර එවැනි නියෝජනයන් පිටපත් 3 කින් යුතුව ලිඛිතව, අනුරාධපුර පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලැබෙන්නට ලියාපදිංචි තැපෑලෙන් එවන ලෙස මෙයින් ඉල්ලා සිටිමි.

කේ. ඒ. කරුණාරත්න,
නිල කමිටුවේ සභාපති හා
පළාත් පාලන සහකාර කොමසාරිස්, අනුරාධපුර.

10–685—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

# තනතුරු – ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි

**1. දීමනා.**—රජයේ නිලධාරීන්ට අදාළ වන ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ජීවනාධාර දීමනාවක් ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතට හා පළාත් පාලන සේවා රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අනිකුත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

**3. සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(අ) 1952 අගෝස්තු මස 8 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරන ලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද, කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනික් තනතුරුද, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතට මාරුකරනු නොලැබූ ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සමාජිකයින් විසින් උසුලනු ලබද්දී, 1962 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේය.

(ආ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුද හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මාරුකර හරිනු ලැබුවහොත්, ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් ආරක්ෂා වේ.

(ඇ) ප්‍රාදේශීය බලමණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථාවේ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම් තීරණය කරනු ලබන්නේ, 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනත ප්‍රකාර, පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්ද ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බලමණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුවය.

(ඈ) පළාත් පාලන විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම රෙගුලාසි යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු බවට ප්‍රකාශ කරනු නොලැබූ තනතුරුවලට කෙරෙන පත්වීම් සම්බන්ධයෙන් වූ විට, එම තනතුරුවලට පත්කරනු ලබන අය 1969 අංක 18 දරණ පළාත් පාලන සේවා පනතෙහි 18 වන වගන්තිය යටතේ පිහිටවනු ලැබූ පළාත් පාලන සේවා අර්ථසාධක අරමුදලට, ස්වකීය වැටුපෙන් සියයට පහක් (5%) දයක මුදල් වශයෙන් ගෙවිය යුත්තාහ. අදළ නිලධාරීන්ගේ වැටුපෙන් සියයට හත හමාරක් (7½%) ඔවුන් පත්කරනු ලබන ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඔවුන් වෙනුවෙන් ගෙවනු ලැබේ.

(ඉ) ස්ත්‍රීන්ද, වයස 55 ට වැඩි නිලධාරීන්ද පළාත් පාලන සේවයට පත්කරන ලද දිනයට ඉස්සරින්ද ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන්ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කෙරෙන සියලු දෙනාටම, 1952 ජූනි 30 වැනි දිනය හා 10,329 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය අනුමාන මූලික වැටුපෙන් සියයට හතරක (4%) මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ අනුමාන මූලික වැටුපෙන් සියයට තුනක (3%) දයක මුදලක් ගෙවනු ලැබේ.

(ඊ) ප්‍රාදේශීය බලමණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක්, මුලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරුවලට පත්වන්නන්ට නියම කළ හැකිය.

(උ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුවද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම් ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට ගොනු සිටීමට නියම කරනු ලැබේ.

(ඌ) අන්‍යාකාරයකින් නියමකොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම් අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(එ) අයදුම්කරුවන්, නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

(ඒ) පත්කරනු ලබන අය දිවයිනෙහි ඕනෑම පෙදෙසක සේවය කළ යුතුයි.

**4. පළාත් පාලන සේවයට නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියමකොට නැත්නම් අවුරුදු 3ක් වන්නේය.

(ii) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත්, ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා දැනට පවත්නා වූත් හෝ මින්මතු සම්පාදනය කළහැකි වූ කිසියම් නියෝග හෝ නීතිරීතිවලට එකඟවීමේ කොන්දේසියට සියලුම නව ප්‍රවේශක නිලධාරීන් එකඟ විය යුතුය.

(iii) රාජකාරි කටයුතු කාර්යක්ෂම ලෙස ඉටුකිරීමෙහි ලා අත්‍යවශ්‍ය නොවන්නාවූ විශේෂ අවස්ථාවන්හිදී හැර, ඔවුන් සවකීය ආධුනික/වැඩ පරීක්ෂණ කාලපරිච්ඡේදය ඇතුළත රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමේ දැනුමක් ලබාගත යුතුය.

(iv) ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, නියමිත කාලසීමාව තුළදී කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයට වඩා ඉහළ නොවන මට්ටමක් දක්වා වූ සිංහල පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. නියමිත කාලසීමා ඇතුළත දී මෙම පරීක්ෂණවලින් අසමත්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් එසේ නියමිත පරීක්ෂණවලින් සමත්වන තුරු, නියමිත වැටුප් වැඩවීම් නොගෙවනු ලබන අතර, ස්වකීය ආධුනික කාලය/වැඩ පරීක්ෂණ කාලය අවසාන වනවිට, සිංහල ප්‍රවීණතාවය පිළිබඳ නියමිත තත්ත්වය ලබා ගැනීමට අසමත් වන නිලධාරීන්ගේ සේවය අවසන් කරනු ලැබිය හැකිය.

**(v) අධ්‍යාපනික සහ අනිකුත් සුදුසුකම්.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ ඊට උසස් විභාගයකින් හෝ සාමාර්ථ්‍යය අඩුම සුදුසුකම වශයෙන් නියමකොට ඇත්තා වූ සෑම බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටියකදීම සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහලයෙකු වන අයදුම්කරුට ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් ලබන ලද සිංහල භාෂාව පිළිබඳ හෝ ඊට සමාන විෂයයකින් සම්මානයක් තිබිය යුතුය.

**(1963 පෙබරවාරි මස 8 වැනි දිනට පූර්ව වූ දිනයක සිට පළාත් පාලන සේවයේ සිටියා වූත්, පළාත් පාලන සේවයේ වෙනත් තනතුරු ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් කෙරෙහි මේ අවශ්‍යතාව අදළ නොවේ.)**

**සටහන.**—(i) පළාත් පාලන සේවයට ඇතුලුවීම සඳහා සිංහල මාධ්‍යයෙන් සුදුසුකම් ලබාගන්නා අය, තනතුර ස්ථිර කිරීම සඳහා පූර්ව අවශ්‍යතාවයක් වශයෙන් වූ සිංහල ප්‍රවීණතා පරීක්ෂණ සමත්වීමෙන් නිදහස් කරනු ලබති.

(ii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා "නව ප්‍රවේශක" යන පදය අදල වනුයේ 1960.1.29 දින හෝ ඊට පසුව ප්‍රසිද්ධ කරන ලද ගැසට් නිවේදන අනුව පළාත් පාලන සේවයේ තනතුරුවලට පළමුවරට පත්කරනු ලබන නිලධාරීන්ටය.

(iii) රජයේ සේවයෙහි නියැලිව සිට, පළාත් පාලන සේවයේ තනතුරු භාරගැනීම සඳහා සේවයෙන් නිදහස් කරනු ලබන්නාවූ "ආදි ප්‍රවේශක නිලධාරීන්" කෙරෙහි ඉහත 4 වැනි ඡේදයේ (iii) හා (iv) දරණ ඡේදවල සඳහන් විධිවිධාන අදල නොවේ.

**5.** සැම අයදුම්කරුවෙකු විසින්ම, තමා ලාංකිකයකු බවට සැහෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. "ලාංකිකයා" යනු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

**6. සේවාමුක්ත භටයින් සඳහා අනුග්‍රහ.**—(අ) සේවාමුක්ත වූ අයදුම් කරුවනට, ඔවුන්ගේ නිත්‍ය භට හමුද සේවා කාලය, තම වයසින් අඩුකර ගැනීමෙන්, ඉල්ලුම්කර ඇති තනතුරුවල නියමිත උපරිම වයස් සීමාව ඇතුළතට පැමිණිය හැකිවන අවස්ථාවක නිත්‍ය භට සේවා කාලපරිච්ඡේදය එසේ අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

(ආ) සේවයේ යම්කිසි තනතුරක් සඳහා බඳවා ගැනීමේ ක්‍රියා පරිපාටියෙහි නියමිත අඩුම අධ්‍යාපන සුදුසුකම, ඊළඟට පහළින් ඇති විභාගය දක්වා අඩු කිරීමට සේවා මුක්තයන් වන අයදුම්කරුවනට අවසර දෙනු ලැබේ.

**7. වයස පිළිබඳ අනුග්‍රහය.**—පළාත් පාලන සේවයේ තනතුරු සම්බන්ධයෙන් පළ කෙරෙන පුරප්පාඩු සඳහා වයස් සීමාවන් ගැන නොතකාම අයදුම්පත් එවීමට ස්ථිර තනතුරක් දරණ, වර්ෂ දෙකක අඛණ්ඩ සේවාවක් ඇති ප්‍රාදේශීය බලමණ්ඩලයන්හි සේවකයන්ට පුළුවන.

**8. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දනට පළාත් පාලන මණ්ඩලයක සේවයේ යෙදී සිටින නිලධාරීන් අයදුම්පත් තම තමන් සේවය කරන ප්‍රාදේශීය බලමණ්ඩල සභාපති මගින් හෝ නාගරික කොමසාරිස්වරයා මගින් හෝ ඉදිරිපත් කළ යුතුයි.

(ii) දනට ආණ්ඩුවේ සේවයෙහි යෙදී සිටින නිධලාරීන්ගේ අයදුම්පත් ඉදිරිපත් කළ යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන්ගේ මාර්ග යෙනි. ආණ්ඩුවේ සේවයේ ස්ථිර තනතුරු දරණ නිලධාරීන් එවන අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් විසින්ම එම අයදුම්කරුවන් තෝරාගනු ලැබුවහොත්, ඔවුන් ස්වකීය තනතුරුවලින් මුදගන්නට තමන් සූදනම්ව සිටිද්ද නැද්දයි සඳහන් කළ යුතුය.

(iii) සම්මුඛ පරීක්ෂණයක් හෝ ලිඛිත පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන ස්ථානයකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකිය. මේ සම්බන්ධයෙන් කිසිම ගමන් වියදමක්, අන්කිසි වියදමක් හෝ ගෙවනු නොලැබේ.

(iv) කිසිම අපේක්ෂකයෙකු ගැන නිර්දේශයක් කිරීමට යම් තැනැත්තකුට වුවමනා නම්, ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙහි. යම අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවද අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන්ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

(v) යම් අයදුම්කරුවකුගේ අයදුම්පතෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන්කොට තිබෙන බැව් ඔහු තෝරාගැනීමට කලින් දනගන්නට ලැබුණි නම්, ඒ හේතුවෙන්ම එම තනතුරට නුසුදුස්සකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම්, රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(vi) මේ දන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නොගැල පෙන අයදුම්පත් ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(vii) පහත සඳහන් ආකෘති පත්‍රය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත (ඔහුගේ පෞද්ගලික නමට නොවෙ) එවිය යුතුයි.

(viii) අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු මේ කාර්යාලයට ලැබෙන අයදුම්පත් සාමාන්‍යයෙන් සළකා බලනු නොලැබේ. අයදුම්පතක් තැපැලේදී ප්‍රමාද වූ බවට හෝ නැති වූ බවට කෙරෙන කිසිම පැමිණිල්ලක් සළකා බලනු නොලැබේ. අවසාන දිනය වනතුරු ස්වකීය අයදුම්පත් ඉදිරිපත් කිරීම ප්‍රමාද කරන අයදුම්කරුවෝ තුමූම ඒ අවදනමට මුහුණ පාති.

**අත්‍යාකාරයකින් සඳහන්කොට නැති කල්හි භාවිත කළ යුතු අයදුම්පත ආකෘතිය**

## පළාත් පාලන සේවය

**සැ.යු.**—(i) අයදුම් පත්‍ර පහත සඳහන් ආකෘතියෙහි පිළියෙල කොට තනතුරු අදළ වන ගැසට් නිවේදනයෙහි සඳහන්, අයදුම් පත්‍ර භාර ගන්නා අවසාන දින හෝ ඊට පළමු, කොළඹ 1, තැ. පෙ. 530, පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන්නට එවිය යුතුයි. අයදුම් පත්‍ර, ලේකම්ගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි.

(ii) තනතුරු ඉල්ලා සිටීම සඳහා තමා සාකල්‍යයෙන්ම සුදුසුබැව් නිශ්චය කරනු පිණිස, තම අයදුම්පත්‍ර පිළියෙල කිරීමට පළමු ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසි හා ගැසට් නිවේදනයේ අවශ්‍යතාද සැළකිල්ලෙන් කියවා බලන ලෙස අයදුම්කරුවන්ට අවවාද කරනු ලැබේ. ගැසට් නිවේදනය බලා අදළ සියලුම තොරතුරු සැපයීමට අයදුම්කරුවෝ වග බලාගත යුතුය.

(iii) පහත සඳහන් ලේඛනවල පිටපත්, අයදුම්කරුවෝ ස්වකීය අයදුම් පත්‍රවලට ඇමිණිය යුතුය. (1) ඉංග්‍රීසි, සිංහල, දෙමළ යන භාෂාවලින් සමත්වී ඇති උසස්ම විභාගය පිළිබඳ සහතිකය, (2) චරිත සහතිකය, (3) ඉල්ලා සිටින තනතුර සම්බන්ධයෙන් අදළවන වෘත්තීය/ශිල්පීය සුදුසුකම් පිළිබඳ සහතිකය.

(iv) ඉහත සඳහන් සාමාන්‍ය කොන්දේසිවල 8 වැනි ඡේදය කෙරෙහි විශේෂ සැළකිල්ල යොමු කරන්න.

**——————————තනතුර සඳහා වූ අයදුම් පත**

1. (අ) පුරප්පාඩුව ප්‍රසිද්ධකොට ඇති ගැසට් පත්‍රයේ දිනය :————.
   (ආ) ඉල්ලුම්කර සිටින තනතුර :————.
2. සම්පූර්ණ නම පැහැදිලි අකුරෙන් :————.
   ජාතිය :————.
   (එම ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු වී නම්, පුරවැසිභාවය පිළිබඳ සහතිකයේ දිනයත්, සැදැහුම් අංකයත් සඳහන් කරන්න.)
3. තැපැල් ලිපිනය :————
   (ලිපිනය වෙනස් වූ වහාම ඒ බව දන්වා එවිය යුතුයි.)
4. (අ) අයදුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයට නියම වයස :—
   අවුරුදු :———, මාස :———, දින :———.
   (ආ) උපන් දිනය :——.

| අවුරුද්ද | මාසය | දිනය |
|---|---|---|
| | | |

5. උපන් ස්ථානය :—
   (අ) අයදුම්කරු :————
   (ආ) අයදුම්කරුගේ පියා :————.
   (ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.
   (ඈ) අයදුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා :————.
   (අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ), (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඇ) සහ (ඈ) පිරවිය යුතුය.)
6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :———.
7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

සාමාන්‍ය අධ්‍යාපනය

| | පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය

| | විද්‍යායතනය | සිට | දක්වා |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග : —
   (අ) සිංහල :————.
   (ආ) ඉංග්‍රීසි :————.
   (ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ ශිල්පීය සුදුසුකම් ලැබූ දින හා ආයතනවල නම් :————.

10. වෘත්තීය/කාර්මික/කර්මාන්ත පළපුරුද්ද :—.

| ආයතනයේ නම | ආධුනිකත්වයේ ස්වභාවය/ දරූ තනතුර | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

(සහතිකවල පිටපත් ඇමිණිය යුතුයි.)

11. (අ) පාඨශාලාවෙන් අස් වූ දින සිට කළ රක්ෂා (පත් වූ දිනයත් හා අස් වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න.) :————.

(ආ) මීට පළමු, ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් හෝ රක්ෂාවෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු) පළාත් පාලනායතන හා කාල සීමාවන් :————.

(ඈ) දනට කරන රක්ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත්වූ දිනය :————.

(ii) දීමනා හැර දනට ලබන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද ? :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම්—සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දිනය හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කථා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :—

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්.—ගැසට් නිවේදනයෙහි සඳහන්කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේනම්, ඒ පිළිබඳව සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේද ? එසේනම් දිනය, නඩු අංකය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :—

15. මුදල් කරදරවලින් නිදහස්ද? එසේ නැත්නම්, ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.

(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව, පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම් පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයාගනු ලැබුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත්, වන්දියක් නොමැතිව මා සේවයෙන් පහකළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ ලේකම්,
තැ. පෙ. 530,
කොළඹ 1.

---

## පළාත් පාලන සේවය

### කාර්යාල කාර්ය සහායක තනතුර—තිස්පනෝ ගම්සභාව

තිස්පනෝ ගම්සභා සීමාව තුල ස්ථිර පදිංචියක් ඇති, පහත සඳහන් සුදුසුකම් ලත් ලාංකිකයන්ගෙන් ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප් ක්‍රමය.—රු. 540—30×8—24×1—රු. 804, රු. 636 සහ 732 යන වාර්ෂික වැටුප් වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත. ඊට අමතරව රජයේ ගණන් ප්‍රමාණයන්ට අනුව නියමිත දීමනා ගෙවනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම් :

(අ) 1970 නොවැම්බර් 30 වැනි දිනට වයස අවුරුදු 20 ට නො අඩු 35 නොවැඩි විය යුතුයි.

(ආ) සිංහල/දෙමළ 6 වැනි ප්‍රමාණයෙන් සමත් වී සිටිය යුතුය.

4. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර ඇති පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම සම්බන්ධයෙන් අදාල වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

5. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට, 1970 නොවැම්බර් 20 දිනට හෝ ඊට ප්‍රථම, වටද්දර තිස්පනෝ ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්න එවිය යුතුය.

ශූ. බී. ජයසුන්දර,
තිස්පනෝ ගම්සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් 5 දින,
වටද්දර, තිස්පනෝ ගම්සභා කාර්යාලයේදීය.

10-882—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

# අතුරු ව්‍යවස්ථා

ඇල්.බී—බී. 66/47

## පොල්ගහවෙල සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) සහ 152 වැනි වගන්ති යටතේ පොල්ගහවෙල සුළු නගර සභාව විසින් සම්පාදිතව ඒ ආඥාපනතේ 153 වැනි වගන්තිය යටතේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිවරයා විසින් අනුමත කරන ලද අතුරු ව්‍යවස්ථාව.

බී. එච්. ද සොයිසා,
අතිරේක ස්ථිර ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය.

1970 ඔක්තෝබර් මස 10 වැනි දින,
කොළඹ දීය.

### අතුරු ව්‍යවස්ථාව

1970 මැයි මස 22 වැනි දින අංක 14,907 දරන ගැසට් පත්‍රයේ පළවූ 1970 මැයි මස 7 වැනි දින දරන දැන්වීමේ සඳහන් (256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපනතේ 129 (ආ) දරන වගන්තිය යටතේ අය කරනු ලබන කසළ ශෝධන විශේෂ වරිපනම් බද්දෙන්, පොල්ගහවෙල සුළු නගර සභාවේ පරිපාලන සීමා තුළ පිහිටා තිබෙන සෑම කුඹුරක්ම 1970 වර්ෂය සඳහා නිදහස් විය යුතුයි.

10-912—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

# පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම්

## ශුද්ධි පත්‍රය

1970 ජූලි මස 2 වැනි දින අංක 14,912/8 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව සහ මහාරච්චිමුල්ල යන ගම් ප්‍රදේශවල ඇතුළට පවත්නා ඡන්ද කොට්ඨාශ නව ඡන්ද කොට්ඨාශවලට බෙදීම සම්බන්ධයෙන් වූ ගම් සභා ආඥාපනතේ 8 වැනි වගන්තිය යටතේ නියෝගයට අදාල දෙවැනි උපලේඛනයේ සඳහන් අංක 13, 14 සහ 15 දරන ඡන්ද කොට්ඨාශ විස්තර පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.

| | |
|---|---|
| ඉහළ කලල්පිටිය (273) | ... අංක 13—ඉහළ කලල්පිටිය—ඉහළ කලල්පිටිය, පාතයාය සහ මාබෝපිටිය යන ගම් වලින් සමන්විතය. |
| | අංක 14—හුම්බුළුව—හුම්බුළුව යන ගමින් සමන්විතය. |
| අලව්ව (271) | ... අංක 15—අලව්ව—අලව්ව, තඹුගහ ගෙදර සහ වැරැල්ලගම යන ගම්වලින් සමන්විතය. |

1—836—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

# ආදයම් හා වියදම් පිළිබඳ වාර්තා

## රාගම සුළු නගර සභාව

### 1967 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශය

**ආදයම**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම ... ... ... | 49,488 27 |
| බී.—මහා මාර්ග ... ... ... | — |
| සී.—නගර සහා ඉඩම් හා ගොඩනැගිලි ... ... | — |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... ... | 12,135 88 |
| ඊ.—මහජන විනෝදය ... ... | 55 0 |
| | 61,679 15 |
| **වෙනත් ලැබීම්—** | |
| තැන්පත් ... ... ... | 5,418 04 |
| රජයේ ආධාර ... ... ... | 6,500 0 |
| කණුවන ගම් සභාවේ ගිණුම ... ... | 12,739 20 |
| අත්තිකාරම් ... ... ... | 455 0 |
| විවිධ ණයහිමියෝ ... ... ... | 8,053 12 |
| මූලික වියදම් සඳහා රජයේ ආධාර ... ... | 5,000 0 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම—** | |
| (අ) දේපල බදු ... ... ... | 8,006 58 |
| (ආ) වැසිකිළි ගාස්තු ... ... | 768 0 |
| (ඇ) කුලී ... ... ... | 8,505 88 |
| | 1,17,124 97 |

**වියදම**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම ... ... ... | 28,615 48 |
| බී.—මහා මාර්ග ... ... ... | 6,505 0 |
| සී.—නගර සහා ඉඩම් හා ගොඩනැගිලි ... ... | 3,275 47 |
| ඩී.—මහජන සෞඛ්‍යය ... ... ... | 12,014 25 |
| ඊ.—මහජන විනෝදය ... ... ... | 1 0 |
| | 50,411 20 |
| **වෙනත් ගෙවීම්—** | |
| තැන්පත් ... ... ... | 1,975 79 |
| රජයේ ආධාර ... ... ... | — |
| අත්තිකාරම් ... ... ... | 1,156 0 |
| විවිධ ණයගැතියෝ ... ... ... | 4,261 74 |
| මූලික වැඩ සඳහා රජයේ ආධාර ... ... | 5,000 0 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම—** | |
| (අ) දේපල බදු ... ... ... | 36,081 31 |
| (ආ) වැසිකිළි ගාස්තු ... ... | 1,782 0 |
| (ඇ) කුලී ... ... ... | 8,505 88 |
| 67.12.31 වැනි දිනට මුදල් ශේෂය ... ... | 7,951 05 |
| | 1,17,124 97 |

රාගම සුළු නගර සභාවේ සභාපති, කොන්ගනිගේ ජෝන් රෝලන්ඩ් ඇන්තනි වන මම, ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1967 දෙසැම්බර් 31 වෙනි දිනට රාගම සුළු නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳව සත්‍යවූත්, නිවැරදිවූත්, ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

සී. ජේ. රෝලන්ඩ් ඇන්තනි,
සභාපති,
රාගම සුළු නගර සභාව.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

සී. රූබට් ඇන්තනි,
අංක 5 කොට්ඨාශයේ නියෝජිත,
රාගම සුළු නගර සභාව,

1970 සැප්තැම්බර් මස 4 වැනි දින කොළඹදී මා ඉදිරිපිට අත්සන් කර දිවුරුම් දුන් බවට සහතික කරමි.

1970 සැප්තැම්බර් මස 4 වැනි දින,
රාගම සුළු නගර සභා කාර්යාලය, රාගම.

එෆ්. එන්. ජයරත්න,
සමාදාන විනිශ්චයකාර.

## රාගම සුළු නගර සභාව

### 1967 දෙසැම්බර් මස 31 දිනට වත්කම් හා බැරකම් ප්‍රකාශය

**බැරකම්**

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| තැන්පත් ... ... | | | 6,505 25 |
| රජයේ ආධාර— | | | |
| පාරවල් සඳහා ... | 6,500 0 | | |
| ප්‍රජා මණ්ඩල ... ... | 100 0 | | |
| කැලිකසල ... ... | 525 0 | | |
| දරකාභිවෘද්ධි මධ්‍යස්ථානය ... | 412 0 | | |
| | | | 7,537 0 |
| විවිධ ණයහිමියෝ ... | | | 16,847 62 |
| කණුවන ගම්සභාවට ගෙවිය යුතු මුදල | | | 3,360 72 |
| අධිකතා හා ඌනතා ගිණුම (සාමාන්‍ය) | | | |
| 1967.2.1 ට අතිරික්තය ... | | 13,111 04 | |
| 1967 වර්ෂයේ ආදයම ... | 61,679 15 | | |
| 1967 වර්ෂයේ වියදම ... | 50,411 20 | | |
| | | 11,267 95 | |
| | | | 24,378 99 |
| | | | 58,629 58 |

**වත්කම්**

| | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| හිඟ ආදයම්— | | |
| දේපල බදු හිඟ ... | ... 38,776 85 | |
| වැසිකිළි ගාස්තු හිඟ ... | ... 4,256 0 | |
| කුලී හිඟ ... ... | ... 47 19 | |
| | | 43,080 04 |
| අත්තිකාරම් ... ... | ... | 1,414 0 |
| විවිධ ණයගැතියෝ ... | ... | 6,184 49 |
| 1967.12.31 දිනට ඉතිරි මුදල් ... | ... | 7,951 5 |
| | | 58,629 58 |

රාගම සුළු නගර සභාවේ සභාපති, කොන්ගනිගේ ජෝන් රෝලන්ඩ් ඇන්තනි වන මම, ඉහත සඳහන් ප්‍රකාශය මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1967 දෙසැම්බර් 31 වෙනි දිනට රාගම සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳව සත්‍යවූත් නිවැරදිවූත් ප්‍රකාශයක් බවට මෙයින් සහතික කරමි.

සී. ජේ. රෝලන්ඩ් ඇන්තනි,
සභාපති,
රාගම සුළු නගර සභාව.

ඉහත සඳහන් ප්‍රකාශය නිවැරදි බවට සහතික කරමි.

සී. රූබට් ඇන්තනි,
අංක 5 කොට්ඨාශයේ නියෝජිත,
රාගම සුළු නගර සභාව.

1970 සැප්තැම්බර් මස 4 වැනි දින කොළඹදී මා ඉදිරිපිට අත්සන් කර දිවුරුම් දුන් බවට සහතික කරමි.

එෆ්. එන්. ජයරත්න,
සමාදාන විනිශ්වයකාර.

1970 සැප්තැම්බර් මස 4 වැනි දින,
රාගම සුළු නගර සභා කායර්‍යාලය,
රාගම.

10-897—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## හෝමාගම සුළු නගර සභාව

### 1969 දෙසැම්බර් මස 31 වැනි දිනට වත්කම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනය

**බැරකම්**

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| තැන්පත් | | | 48,869 | 60 |
| ස්ථිර තැන්පත් | | | 13,500 | 0 |
| රජයේ ආධාර | | | 20,455 | 73 |
| විවිධ ණයහිමියෝ | | | 23,334 | 96 |
| අතිරික්තය (සාමාන්‍ය)— | | | | |
| 68.12.31 දිනට අධිකය | 2,02,835 | 83 | | |
| 1969 වර්ෂයේ සකස් කිරීමේ බැර | 8,019 | 03 | | |
| | 2,10,854 | 86 | | |
| 1969 වර්ෂයේ අය | 2,46,179 | 10 | | |
| | 4,57,033 | 96 | | |
| 1969 වර්ෂයේ වැය | 2,37,142 | 40 | | |
| | | | 2,19,891 | 56 |
| අතිරික්තය (විදුලිය)— | | | | |
| 1968.12.31 දිනට අධිකය | 84,084 | 38 | | |
| 1969 වර්ෂයේ සකස් කිරීම් බැර | 1,430 | 81 | | |
| | 85,515 | 19 | | |
| 1969 වර්ෂයේ අය | 97,032 | 53 | | |
| | 1,82,547 | 72 | | |
| 1969 වර්ෂයේ වැය | 1,46,960 | 57 | | |
| | | | 35,587 | 15 |
| | | | 3,61,639 | 0 |

**වත්කම්**

| | රු. | ශ. |
|---|---|---|
| අත්තිකාරම් | 12,216 | 48 |
| දේපල බදු හිඟ | 89,717 | 93 |
| මලපවාහන බදු හිඟ | 89 | 0 |
| කුලී හිඟ | 3,425 | 14 |
| විදුලිය ගාස්තු හිඟ | 13,242 | 22 |
| විවිධ ණයගැතියෝ | 22,606 | 58 |
| ක්ෂය සංචිතය (ස්ථිර තැන්පත්) | 13,500 | 0 |
| 1969.12.31 දිනට මුදල් පොතේ ඉතිරිය | 2,06,841 | 65 |
| | 3,61,639 | 0 |

හෝමාගම සුළු නගර සභාවේ සභාපති තැන්පත් මඩපාත කංකානමලාගේ දෙන් විල්ප්‍රඩ් සේනානායක වන මම ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1969.12.31 දිනට හෝමාගම, සුළු නගර සභාවේ වත්කම් හා බැරකම් පිළිබඳ සත්‍යවූත්, නිවැරැදි වූත් වාර්තාවක් බව මෙයින් සහතික කරමි.

විල්ප්‍රඩ් සේනානායක,
හෝමාගම සුළු නගර සභාවේ සභාපති.

එච්. ඩී. මෛත්‍රීදස,
නගර සභික.

1970 මාර්තු මස 12 වැනි දින මා ඉදිරිපිටදී සහතික කරන ලදී.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සමාදාන විනිශ්වයකාර තැන.

## හෝමාගම සුළු නගර සභාව

### 1969 වර්ෂයේ ආදයම් හා වියදම් ප්‍රකාශනය

**ආදයම**

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය ආදයම | 2,01,043 | 50 | | |
| බී.—මහා මාර්ග | — | | | |
| සී.—නගර සහා ඉඩම් | 9 | 0 | | |
| ඩී.—මහජන සෞඛ්‍යය | 27,680 | 20 | | |
| ඊ.—මහජන විනෝදය | 17,416 | 40 | | |
| එෆ්.—සුසාන භූමි | 30 | 0 | | |
| ජී.—සුනඛ ලියාපදිංචිය | — | | | |
| එච්.—කිරුම් හා මිනුම් | — | | | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාවීම | — | | | |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල | — | | | |
| | | | 2,46,179 | 10 |

**වියදම**

| | රු. | ශ. | රු. | ශ. |
|---|---|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම | 58,074 | 47 | | |
| බී.—මහා මාර්ග | 1,01,526 | 63 | | |
| සී.—නගර සහා ඉඩම්/ගොඩනැගිලි | 4,108 | 86 | | |
| ඩී.—මහජන සෞඛ්‍යය | 66,140 | 24 | | |
| ඊ.—මහජන විනෝදය | 2,440 | 0 | | |
| එෆ්.—සුසාන භූමි | — | | | |
| ජී.—සුනඛ ඝාතනය | — | | | |
| එච්.—කිරුම් හා මිනුම් | — | | | |
| අයි.—ගින්නෙන් ආරක්ෂාවීම | — | | | |
| ජේ.—කියවීම් ශාලා සහ පුස්තකාල | 4,852 | 20 | | |
| | | | 2,37,142 | 40 |

| වෙනත් ලැබීම්— | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1. තැන්පත් ... ... | 42,941 26 | |
| 2. අත්තිකාරම් ... ... | 14,888 22 | |
| 3. අතිරික්තය (සාමාන්‍ය) ... | 8,019 03 | |
| 4. අතිරික්කය (විදුලිය) ... | 1,430 81 | |
| 5. විදුලිය ගිණුම ... ... | 97,032 53 | |
| 6. රජයේ ආධාර ... ... | 6,850 0 | |
| 7. විවිධ ණයගැතියෝ ... | 17,997 41 | |
| 8. විවිධ ණයහිමියෝ ... ... | 23,334 96 | |
| 9. ක්ෂය සංචිතය ... ... | 2,000 0 | |
| | | 2,14,494 22 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම—** | | |
| ඒ.—දේපල බදු ... ... | 94,711 18 | |
| බී.—මලපවාහන බදු ... ... | 508 0 | |
| සී.—කුලී ... ... | 14,800 0 | |
| ඩී.—වරිපනම් දඩ මුදල් ... | 265 40 | |
| ඊ.—විදුලිය ගාස්තු ... ... | 79,405 80 | |
| | | 1,89,690 38 |
| 1968.12.31 දිනට ඉතිරි මුදල ... | | 2,21,490 32 |
| | | 8,71,854 02 |

| වෙනත් ගෙවීම්— | රු. ශ. | රු. ශ. |
|---|---|---|
| 1. තැන්පත් ... ... | 30,925 83 | |
| 2. අත්තිකාරම් ... ... | 14,661 40 | |
| 3. රජයේ ආධාර ... ... | 2,047 55 | |
| 4. විදුලිය ගිණුම් ... ... | 1,46,960 57 | |
| 5. විවිධ ණයහිමියෝ ... ... | 26,575 89 | |
| 6. විවිධ ණයගැතියෝ ... ... | 15,395 03 | |
| 7. අතිරික්කය හා ඌනතා ගිණුම ... | — | |
| 8. අතිරික්තය (විදුලිය) ... | — | |
| 9. ස්ථිර තැන්පත් ... ... | 2,000 0 | |
| | | 2,38,566 27 |
| **ආදයම් එකතු කිරීමේ ගිණුම—** | | |
| ඒ.—දේපල බදු ... ... | 97,488 72 | |
| බී.—මලපවාහන බදු ... ... | 437 0 | |
| සී.—කුලී ... ... | 16,355 25 | |
| ඩී.—වරිපනම් දඩ මුදල් ... ... | 265 40 | |
| ඊ.—විදුලිය ගාස්තු ... ... | 74,757 33 | |
| | | 1,89,303 70 |
| 1969.12.31 වැනි දිනට ඉතිරි මුදල ... | | 2,06,841 65 |
| | | 8,71,854 02 |

හෝමාගම සුළු නගර සභාවේ සභාපති තැන්පත් මධපාන කංකානමලාගේ දෙන් විල්ප්‍රඩ් සේනානායක වන මම, ඉහත සඳහන් වාර්තාව මගේ සම්පූර්ණ දැනීමේ හා විශ්වාසයේ හැටියට 1969 වර්ෂයේ හෝමාගම සුළු නගර සභාවේ ආදයම් හා වියදම් පිළිබඳ නිවැරැදි වූත්, සත්‍යවූත්, වාර්තාවක් බවට සහතික කරමි.

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

නිවැරැදි බවට සහතික කරමි.

එච්. ඩී. මෛත්‍රීදස,
හෝමාගම නගර සතික.

1970ක් වූ මාර්තු මස 12 වැනි දින මා ඉදිරිපිට මහරගමදී සහතික කරන ලදී.

ඩබ්ලිව්. සිරිසේන පෙරේරා,
සමාදාන විනිශ්චයකාර තැන.

10–681—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

# අය - වැය ලේඛන

## පුස්සැල්ලාව සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40/11/ දරණ කොටස යටතේ අයදුම් පත**

### 1970 අය-වැය ලේඛනය

1970 අය-වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල්වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද පහත දැක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දැක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1970 සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 23 දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

**1 වැනි කොටස—සාමාන්‍ය**

**ඉතිරි මුදල් වැය ශීර්ෂ**

| | රු. ශ. |
|---|---|
| **සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :** | |
| **(7) අළුත් කර්මාන්ත .... ... ...** | **11,795 0** |
| | 11,795 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂ**

| | රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම : | |
| (2) කාර්‍ය්‍ය මණ්ඩලයේ වියදම්— | |
| (බී) ගමන් වියදම් ... ... ... | 200 0 |
| බී.—මහා මාර්ග : | |
| (1) වේතන හා දෛනික වැටුප්— | |
| (බී) ඕවර්සියර්වරුන්ට ... ... | 150 0 |
| (4) විථි ආලෝක කිරීම— ... ... | 2,000 0 |
| සී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි : | |
| (4) නඩත්තු කිරීම ... ... ... | 6,370 0 |
| ඩී.—සනීපාරක්ෂාව : | |
| (1) සාමාන්‍ය— | |
| (එන්) මාතෘ නිවාසය හා දරකාභිවෘද්ධි නිවාසය ... | 905 0 |
| (2) කසල ශෝධනය— | |
| (බී) කරත්ත, ගොනුන් හා ලොරි ... ... | 1,020 0 |
| ඊ.—මහජන විනෝදය : | |
| (2) නඩත්තු කිරීම ... ... ... | 1,150 0 |
| | 11,795 0 |

පී. පලනිසාමි,
සභාපති,
සුළු නගර සභාව, පුස්සැල්ලාව.

1970 සැප්තැම්බර් මස 30 වැනි දින,
පුස්සැල්ලාව සුළු නගර සභා කාර්‍ය්‍යාලයේ දිය.

10–896—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## අම්බලන්තොට සුළු නගර සභාව

### අය-වැය ලේඛනය — 1970

### මුදල් රෙගුලාසි අංක 40(II) යටතේ වැය ශීර්ෂ මාරුව

අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදයන් සඳහා වැය සම්මතයන්ගෙන් ඉතිරිවේයයි ගණන් බලන ලද මුදල් පහත සඳහන් අන්දමට යෙදවීමට 1970 අගෝස්තු මස 20 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේදී හම්බන්තොට පළාත් පාලන සහකාර කොමසාරිස්තුමාගේ අනුමතියට යටත්ව සභා සම්මත විය.

**ඉතිරි වැය**

සාමාන්‍ය—

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(2) (සී) අයකැමි ගාස්තු ... ... | 1,000 | 0 |
| ඒ.—(2) (ටී) නීති උපදේශක ගාස්තු ... ... | 250 | 0 |
| ඒ.—(2) (අයි) නිවාඩු දුම්රිය බලපත් ... ... | 200 | 0 |
| ඒ.—(ට) නොමිලේ පාසැල් පොත් බෙදීම ... | 250 | 0 |
| ඩී.—(1) (ටී) මුද්‍රණ ගාස්තු ... ... | 100 | 0 |
| ඩී.—(1) (එච්) කානු ඉදි කිරීම ... ... | 1,000 | 0 |
| ඩී.—(1) (ජේ) සෞඛ්‍ය සතිය ... ... | 200 | 0 |
| ඩී.—(1) (එන්) මාතෘ දරකානිවෘද්ධි මධ්‍යස්ථාන ... | 750 | 0 |
| ඩී.—(3) (ජී) ඉදි කිරීම ... ... | 1,000 | 0 |
| ඊ.—(5) ආධාර හා පරිත්‍යාග ... ... | 250 | 0 |
| | 5,000 | 0 |

**අතිරේක වැය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—(1) (ඒ) වැටුප් ලේකම් ... ... | 100 | 0 |
| ඒ.—(1) (එෆ්) විශ්‍රාම වැටුප් ... ... | 350 | 0 |
| ඒ.—(2) (එෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ දැන්වීම් ප්‍රකාශන ... | 1,500 | 0 |
| ඒ.—(2) (එන්) අතිකාල දීමනා ... ... | 500 | 0 |
| බී.—(2) මාර්ග නඩත්තු කිරීම ... ... | 800 | 0 |
| ඩී.—(2) (බී) කරත්ත, ගොන් සහ ලොරි... ... | 750 | 0 |
| ඩී.—(3) (බී) කරත්ත, ගොන් සහ ලොරි... ... | 750 | 0 |
| ඊ.—(7) විනෝද බදු පරීක්ෂා කිරීම ... ... | 250 | 0 |
| | 5,000 | 0 |

1970 සැප්තැම්බර් මස 11 දින දීය.

කේ. සමරරත්න,
සභාපති.
අම්බලන්තොට සුළු නගර සභාව.

අනුමත කරමි.

පැරකුම් විජේසිංහ,
පළාත් පාලන සහකාර කොමසාරිස්.

1970 ඔක්තෝබර් මස 13 වැනි දින,
හම්බන්තොට, පළාත් පාලන අමාත්‍යාංශ කායාීලයේ දීය.

10–894—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## හෝමාගම සුළු නගර සභාව

### සුළු නගර සභා මුදල් රෙගුලාසි 40(II) යටතේ කෙරෙන අයදුම් පතයි

1970 අය වැය ලේඛනයේ ඒ ඒ වැය ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදලින් ඉතිරිවේයයි ගනන් බලන ලද පහත පෙනෙන වැය ශීර්ෂයන් යටතේවූ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂයන්ට මාරුකර අවශ්‍යව් තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂයන් යටතේ යෙදවීමට 1970 ක්වූ සැප්තැම්බර් මස 30 වැනි දින පවත්වන්ට යෙදුන මාසික සභා රැස්වීමේදී අංක 11 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

**මුදල් ඉතිරි වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඩී. 2 (බී).—කරත්ත ගොනුන් හා ලොරි, ට්‍රැක්ටර් හා ට්‍රේලර් ඉන්ධන | 35,000 | 0 |
| ඩී. 3 (පි).—ඉදිකිරීම ... ... ... | 3,500 | 0 |

**මුදල් අවශ්‍ය වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඩී. 1 (එච්).—කාණු සෑදීම ... ... ... | 35,000 | 0 |
| බී. (8).—අලුත්වැඩ ... ... ... | 3,500 | 0 |

විල්ප්‍රඩ් සේනානායක,
සභාපති,
හෝමාගම සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලයය,
හෝමාගම, 1970, ඔක්තෝබර් මස 10 වෙනිදින.

10–680—70.10.23 දින අංක 14,929 දරණ ගැසට් පත්‍රය

---

## රත්තොට සුළු නගර සභාව

### ලංකාණ්ඩුවේ ප්‍රඥප්ති සංග්‍රහයේ 261 වන පරිච්ඡේදය වන පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) ආඥාපනත

ලංකාණ්ඩුවේ ප්‍රඥප්ති සංග්‍රහයේ 261 වන පරිච්ඡේදය වන පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 ඡේදය යටතේ රත්තොට සුළු නගර සභාවේ 1970.7.16 දින කාරණා අංක 10 යටතේ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද පහත සඳහන් යෝජනාව මෙයින් ප්‍රකාශයට පත් කරමි.

### යෝජනාව

ගරු පළාත් පාලන ඇමතිතුමන් විසින් සම්පාදිත මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් හා සෙනේට් සභාවෙන් අනුමැතිය ලත්, 1954 මාර්තු මස අංක 10,657 දරණ ගැසට් පතෙහි පළකර ප්‍රසිද්ධ කරන ලද පොදු අතුරු ව්‍යවස්ථා මාලාවේ VII වන කොටස වන අප්‍රිය හා අන්තරාදයක කර්මාන්ත පිළිබඳ කොටස, මෙම යෝජනාව ගැසට් පත්‍රයේ පළවූ දින සිට බල පැවැත්වෙනසේ සම්පූර්ණයෙන්ම පිළිගැනීමට ලංකාණ්ඩුවේ ප්‍රඥප්ති සංග්‍රහයේ 261 වන පරිච්ඡේදය වන පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) ආඥාපනතේ 3 ඡේදය යටතේ රත්තොට සුළු නගර සභාවේ 1970.7.16 දින පවත්වන ලද මාසික රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලදි.

යාපා. ඩී. පියුමසිංහ,
සභාපති,
රත්තොට සුළු නගර සභාව.

1970.10.6 දින,
රත්තොට සුළු නගර සභා කායාීලයේදී ය.

10–890/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## රත්කොට සුළු නගර සභාව

**1970 අය-වැය ලේඛනය**

මුදල් රෙගුලාසි 40 (ii) යටතේ වැය ශීර්ෂ හුවමාරුව

1 කොටස—සාමාන්‍ය

**මුදල් ඌනතා වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ. 1 (ඒ).—ලේකම් ... ... ... | 20 | 52 |
| (බී).—ලිපිකරුවෝ ... ... ... | 1,975 | 0 |
| (සී).—ආදයම් පරීක්ෂකයෝ ... ... | 310 | 0 |
| (ඩී).—කායර්‍යාල කාර්‍ය සහයකයෝ ... | 670 | 0 |
| ඒ. 2 (බී).—ගමන් ගාස්තු ... ... | 460 | 0 |
| (ඇප්).—ලිපිද්‍රව්‍ය, මුද්‍රණ ප්‍රකාශණ හා මුද්දර ගාස්තු ... | 775 | 0 |
| බී. 1 (බී).—පාලකවරු ... ... ... | 240 | 0 |
| සී. 4 .—නඩත්තුව ... ... ... | 87 | 90 |
| ඩී. 3(ඒ).—දෛනික වැටුප් ... ... | 1,340 | 19 |
| | 5,878 | 61 |

**මුදල් අධිකතා වැය ශීර්ෂ**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.1 (ඊ).—කාර්මික උපදේශක ගාස්තු ... ... | 35 | 0 |
| (එච්).—නිල ඇඳුම් ... ... ... | 40 | 0 |
| ඒ. 2 (ඒ) . දීමනා ... ... ... | 1,950 | 0 |
| (ජී).—වාහන තහඩු ... ... ... | 25 | 46 |
| (කේ).—කායර්‍යාල භාණ්ඩ හා උපකරණ ... | 1,425 | 0 |
| (ඇල්).—ආරෝග්‍යශාලා ගාස්තු ... ... | 100 | 0 |
| ඒ. 4.—අධාර හා පරිත්‍යාග ... ... | 550 | 0 |
| 5.—නොමිළයේ පාසැල් පොත් සැපයීම ... | 33 | 15 |
| ඩී. 3 (බී).—ගොන්කරත්ත සහ ලොරි ... ... | 500 | 0 |
| (ඊ).—වැසිකිළි නඩත්තුව ... ... | 270 | 0 |
| ඩී. 4. (බී).—නඩත්තුව ... ... ... | 100 | 0 |
| ඊ. 5.—ආධාර හා පරිත්‍යාග ... ... | 100 | 0 |
| ඇප්.—නඩත්තුව ... ... ... | 250 | 0 |
| ජේ. 4.—ද්‍රව භාණ්ඩ ... ... ... | 500 | 0 |
| | 5,878 | 61 |

1970.9.24 දින පැවැති මාසික සභා රැස්වීමේ අංක 11 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

යාපා ඩී. පියුමසිංහ,
සභාපති,
රත්තොට සුළු නගර සභාව.

1970.9.24 දින,
රත්තොට සුළු නගර සභා කායර්‍යාලයේ දී ය.

10–890/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## මතුගම සුළු නගර සභාව

**1970 වර්ෂයේ 2 වැනි පරිපූරක වැය ලේඛනය**

1 වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | රු. | ශ. |
|---|---|---|
| බී.—මහා මාර්ග : | | |
| 2. නඩත්තු කිරීම ... ... ... | 15,000 | 0 |
| 12. අළුත් වැඩ ... ... ... | 15,000 | 0 |
| | 30,000 | 0 |

1970 සැප්තැම්බර් මස 28 වෙනි දින පවත්වන ලද මතුගම සුළු නගර සභාවේ මාසික සභා රැස්වීමේදී අංක 4 දරණ යෝජනාවෙන් සභා සම්මත විය.

දයා ටී. පස්කුවල්,
මතුගම සුළු නගර සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 10 වෙනි දින,
මතුගම සුළු නගර සභා කායර්‍යාලයේ දී ය.

10–895—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## යටිනුවර ගඟ පළාත ගම්සභාව

**ගෝ ඝාතක ආඥපනත**

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් වන අය එකී උපලේඛනයෙහි සඳහන් ස්ථානයන්හි 1971 වර්ෂයට ගව මස් විකිණීම සඳහා අවසර පත්‍රයක් ඉල්ලා අයදුම්පත් මා වෙත එවා තිබෙන බව ගෝ ඝාතක ආඥපනතේ (272 වැනි අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම අවසර පත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ යටිනුවර ගඟපළාත ගම්සභා බල ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් කුමන කරුණු නිසාද යන වග ලියවිල්ලක් මගින් පිටපත් දෙකක් සහිතව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වා සිටිමි.

උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | පිහිටි ස්ථානය |
|---|---|---|
| අයි. ඇල්. ඇම්. ඇස්. දීන් මයා., නො. 15, යටිනුවර වීදිය, මහනුවර ... | ගව මස් ... | නො. 69/3, පහළ ඊරියගම, පේරාදෙනිය |
| එම ... | එම ... | නො. 68, ගම්පළ පාර, පහළ ඊරියගම, පේරාදෙනිය |

1970 ඔක්තෝබර් මස 10 වැනි දින,
මුරුතලාව,
ගම්සභා කායර්‍යාලයේ දී ය.

ගුණරත්න මානෙල්ලංග,
යටිනුවර ගඟ පළාත ගම්සභාවේ ප්‍රධාන කැන.

10–881—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## මාතලේ මැදසියපත්තු ගම්සභාව—මාතලේ දිස්ත්‍රික්කය

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන අයුරු සඳහන් ස්ථානයෙහි 1971 වර්ෂයට මස්කඩ පවත්වාගෙන යෑම සඳහා බලපත්‍ර ඉල්ලවා ඇති බවත්, එම බලපත්‍ර නිකුත් කිරීම ගැන මාතලේ මැදසියපත්තු ගම්සභා ප්‍රදේශය තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධවන්නේනම් ඒ කුමණ කරුණක් නිසාද යනවග ඇතුලත් ලියවිල්ලක් පිටපත් දෙක බැගින් යුක්තව මෙම දන්වීම ගැසට් පත්‍රයේ එලවන දින සිට දින 14 ක් ඇතුලත ලියා එවීමට බලය තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 අධිකාරය) 7 වන වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | බලපත්‍රයේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| වී. ඇම්. හනිපා ... ... ... | හරක් මස් ... | ''මුදියන්සේලැවත්ත'', වරකාමුර |
| ඇස්. ඇම්. හනිපා ... ... ... | හරක් මස් ... | ''නිකලන්ද වත්ත'', රයිතලාවෙල |

යූ. ඇල්. ඒ. මජීඩ්,
මාතලේ මැදසියපත්තු ගම්සභාපති.

1970 ඔක්තෝබර් මස 12 වෙනි දින,
ගම්සභා කායඨාලය,
උකුවෙල.

10–877—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩන්ගස්ලන්ද ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයේ සඳහන් අය විසින් එකී ස්ථානයේ 1970 වර්ෂයට එළහරක් මස් කඩයක් පවත්වාගෙන යාමට බලපත්‍රයක් ඉල්ලුම් කර සිටින බවත්, ඒ අනුව බලපත්‍ර නිකුත් කිරීම ගැන කුරුණෑගල දිස්ත්‍රික්කයේ දෙඩන්ගස්ලන්ද ගම්සභා ප්‍රදේශයතුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුතු ලියවිල්ලක් මෙම දන්වීම ගැසට් පත්‍රයේ පල වූ දින සිට දින 14 ක් ඇතුලත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) 1967 අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වැනි වගන්තියෙන් සංශෝධිත වූ 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඇම්. පියසේන,
දෙඩන්ගස්ලන්ද ගම්සභාවේ සභාපති තැන.

1970 ඔක්තෝබර් මස 8 වැනි දින,
දෙඩන්ගස්ලන්ද ගම්සභා කායඨාලයේදී ය.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. ඇන්. ඇල්. තාජුදීන් මහතා, තෙළඹුගල්ල, දෙඩන්ගස්ලන්ද | එළහරක් මස් | දෙමටගහමුල්ල වත්ත තෙළඹුගල්ල |

10–679—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## මහනුවර දිසත්‍රික්කයේ පා. දු. පලිස්පත්තු බටහිර ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත උපලේඛනයේ නම් සඳහන් තැනැත්තන් විසින් එකී නම් ඉදිරියෙහි දක්වෙන ස්ථානයන්හි 1971 වර්ෂය තුළ මස් කඩ පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර ඉල්ලුම්කර ඇති බැවින්, එසේ, එම බලපත්‍ර ඉල්ලුම් කරුවන්ට, 1971 වර්ෂයට බලපත්‍ර නිකුත් කිරීම ගැන මහනුවර දිස්ත්‍රික්කයේ පා. දු. පලිස්පත්තු බටහිර ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි ඕනෑම අයෙකු විරුද්ධ වනුයේ නම් එම විරුද්ධත්වය විස්තර සහිතව ලියවිල්ලක් මඟින් පිටපත් දෙකකින් යුතුව සකස් කොට මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලැබෙන්නට සැලැස්විය යුතු බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (257 වැනි අධිකාරිය) 7 වන වගන්තිය ප්‍රකාර මෙයින් දනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාමේ ස්වභාවය | ස්ථානය |
|---|---|---|
| 1. ඒ. ඇම්. හාසිම්, කුඹුක්කඳුර, තෙල්දෙනිය | එළ ගවමස් ... | දිගනතැන්නහේන, දිගන |
| 2. ඒ. බුහාරි, උඩුදූකඩ, තෙල් දෙනිය | එළ මස් ... | 29, නිකතැන්නහේන, උඩුදූකඩ |
| 3. එස්. හලාල්දීන්, උඩුදූකඩ, තෙල්දෙනිය | එළ ගවමස් ... | 29/1, නිකතැන්න හේන, උඩදූකඩ |

ඇම්. ජේ. බී. ඒකනායක,
පා. දු. පලිස්පත්තු බටහිර ගම්සභාවේ සභාපති.

1970 ඔක්තෝබර් මස 9 දින,
පා. දු. පලිස්පත්තු බටහිර ගම්සභා කායඨාලයේදීය,
දිගන, කෙන්ගල්ල.

10–880—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## තිස්සමහාරාම සුළු නගර සභාව

### 1971 සඳහා වූ දේපල බද්ද

සුළු නගර සභා ආඥා පණත (256 වැනි අධිකාරිය)

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥා පණතේ ගත වී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් බදු 1971 වර්ෂයටද එලෙසම පැනවීමට තිස්සමහාරාම සුළු නගර සභාව තීරනය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 (2) වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට හත බැගින් වාර්ෂික බදු පිළිවෙලින් ජූනි 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරු හයමසකට වරක් බැගින් ගෙවිය හැකි වේ.

ජී. පී. ආර්ලිස් සිල්වා,
සභාපති,
සුළු නගර සභාව, තිස්සමහාරාම.

1970.10.9 වන දින,
තිස්සමහාරාම සුළු නගර සභා කාර්යාලයේදීය.

10–914—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## ලුණුගල සුළු නගර සභාව

### 1971 වර්ෂයට දේපල බද්ද

(256 වැනි අධිකාරය වන) සුළු නගර සභා ආඥාපණතේ 159 වැනි වගන්තිය යටතේ මෙම ගත වී යන වර්ෂයට බලපවත්වන පහත සඳහන් දේපල බද්ද 1971 වර්ෂයට ද එලෙසම පැනවීමට ලුණුගල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන කුඹුරු හැර සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමෙන් සියයට හයක් (6%) බැගින් වූ දේපල බද්ද පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනයන්හි සමාන කොටස් හතරකින් ගෙවා අවසන් කල හැකි වේ.

ජී. ඒ. වෝල්ටර් පෙරේරා,
සභාපති.

1970 ඔක්තෝබර් මස 9 වැනි දින,
ලුණුගල,
සුළු නගර සභා කාර්යාලයේදීය.

10–913/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## ලුණුගල සුළු නගර සභාව

### 1971 වර්ෂයට සුනඛ බදු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 අධිකාරය)

ලුණුගල සුළු නගර සභාවේ පාලන සීමාව තුළ ඇති කරනු ලබන සෑම බල්ලෙකු වෙනුවෙන්ම රුපියල් 1 ක් ද, බැල්ලියක් වෙනුවෙන් රුපියල් 1.50 ක් ද, ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1971 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 අධිකාරය) 4 වැනි ඡේදයට අනුව පණවා ඇති බවද, එකී ගාස්තු 1971 මාර්තු මස 31 දිනට හෝ ඊට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජී. ඒ. වෝල්ටර් පෙරේරා,
සභාපති.

1970 ඔක්තෝබර් මස 10 වැනි දින,
ලුණුගල,
සුළු නගර සභා කාර්යාලයේදීය.

10–913/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## ලුණුගල සුළු නගර සභාව

### 1971 වර්ෂයට වාහන හා සතුන් පිළිබඳ බද්ද

### සුළු නගර සභා ආඥාපනත (256 අධිකාරය)

ලුණුගල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) සුළු නගර සභා ආඥාපණතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව, 1971 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා අයකිරීමටද,

(2) එකී පණතේ අංක 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන යම් ඕනෑම වාහනයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියක් හෝ රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් සඳහාම— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (බී) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... | 1 | 0 |
| ගොන් දෙදෙනා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ම ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බර බාගයක් හෝ තිරික්කලයක් සඳහා ම ... ... | 2 | 50 |
| සෑම අත් කරත්තයක් සඳහා ම ... ... | 1 | 0 |
| සෑම ජින්රික්ෂෝවක් සඳහා ම ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ම ... ... | 5 | 0 |
| සෑම ගොනෙකු හෝ බූරුවෙකු සඳහා ම ... | 1 | 0 |

ජී. ඒ. වෝල්ටර් පෙරේරා,
සභාපති.

1970 ඔක්තෝබර් මස 10 වැනි දින,
ලුණුගල.
සුළු නගර සභා කාර්යාලයේදීය.

10–913/3—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## බිබිල ගම්සභාව

### සෝශාතක ආඥාපනත

මෙහි පහත දැක්වෙන උප ලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානයේ 1971 වර්ෂයේ මස් පිණිස සතුන් මරා වෙළඳාම කරගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලමින් අයදුම් පතක් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතක ආඥාපනතේ (272 වන පරිච්ඡේදයේ) 7 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත්කිරීම ගැන මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල ගම්සභා සීමාව තුල පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන කරුණු නිසාද යනවග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් ග්‍රහුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට 14 දිනක් ඇතුලත මා වෙත එවිය යුතු බව මෙයින් දන්වමි.

### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| 1. වයි. ආදම් කනුල්වෙල බිබිල. | ගවමස් | කෝන්ගහවත්ත කනුල්වෙල. |

නිමල් සෙනරත් බණ්ඩාර,
සභාපති.

70. 10. 10 දින,
ගම්සභා කාර්යාලය,
බිබිල.

10–879—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## කළුතර නගරසභාව

### නගර සභා ආඥාපනත

255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 162 (1) (සී) පරිදි ප. පා. ඇමතිතුමා විසින් අනුමත කරනලදුව ලංකාණ්ඩුවේ අංක 14,721 හා 67.10.20 දතම දරණ ගැසට් පත්‍රයේ IVවන කොටසේ (ප.පා.) පල කරන ලද දැන්වීමේ සඳහන් ව්‍යාපාර අතුරින් පහත උප ලේඛනයේ සඳහන් අන්තරාදයක හා අප්‍රසන්න ව්‍යාපාර සඳහා නගර සභා ආඥාපනතේ 164 (2) යටතේ කළුතර නගර සභාව විසින් ලංකාණ්ඩුවේ අංක 14,775 සහ 67.11.17 දින ගැසට් පත්‍රයේ IV වන කොටසේ පලකරන ලද බලපත්‍ර ගාස්තු පහත සඳහන් පරිදි නැවතත් සංශෝධනය කර ගැසට් පත්‍රයේ පළවූ දින සිට වලංගු වන පරිදි පනවනු ලැබේ.

ඇම්. පී. ජේ. ඩයස්,
කළුතර නගර සභාවේ සභාපති වෙනුවට.

1970 ඔක්තෝබර් මස 16 වෙනි දින,
කළුතර, නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | රු. | ශ. |
|---|---|---|---|
| 1. | ගරාජයක් හෝ ගරාජය සමඟ වෑල්ඩින් වැඩ පොලක් පැවැත්වීම ... ... ... | 25 | 0 |
| 2. | වෑල්ඩින් වැඩපලක් පමණක් පැවැත්වීම ... | 10 | 0 |
| 3. | කරවල ගබඩා කිරීම, හො. 3 සිට 5 දක්වා සහ 5 න් ඉහළට පිළිවෙලින් ... ... ... | 10 | 0 |
| | | සහ | |
| | | 30 | 0 |
| 4. | ස්ප්‍රිට් ගබඩා කිරීම, ගැළුම් 1 සිට 10 දක්වා සහ 10 න් ඉහළට පිළිවෙලින් ... ... ... | 10 | 0 |
| | | සහ | |
| | | 25 | 0 |

10–904—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## පුස්සැල්ලාව සුළු නගර සභාව

**1971 වර්ෂය සඳහා රථ වාහන හා සතුන් පිළිබඳ බද්ද**

### 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

පුස්සැල්ලාව සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :—

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත ලේඛණයේ විස්තර වන ගණන් අනුව රථ වාහන හා සතුන් පිළිබඳ බද්දක් 1971 වර්ෂයට පණවා ඇති බව සහ,

(2) එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් ය.

පී. පලනිසාමි,
සභාපති,
පුස්සැල්ලාව සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 15 දින,
පුස්සැල්ලාව සුළු නගර සභා කාර්යාලයේ දීය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින්රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනත් ඕනෑම අන්දමේ වාහණයක් සඳහා ... | 5 | 0 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් :— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කෙරේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම බර කරත්තයක් සඳහා හෝ තිරික්කලයක් සඳහා ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... | 2 | 50 |
| සෑම ජින්රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටලුවෙක් සඳහා ... ... | 1 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... | 1 | 0 |

10-908—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## විශේෂ කොමසාරිස් කාර්යාලය—දර්ගා නගරය

**සුළු නගර සභා ආඥාපනත—256 වැනි අධිකාරය**

### 1971 වර්ෂයට දේපල බද්ද

දර්ගා නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් (256 වන අධිකාරය) වන සුළු නගර සභා ආඥාපණතේ 159 වැනි ඡේදය යටතේ 1970 වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බද්ද 1971 වර්ෂයටද එලෙසම පැනවූ බව ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තියේ ප්‍රකාර දර්ගා නගර සීමාව තුල පිහිටි සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට පහ (5%) බැගින්වූ වාර්ෂික බද්ද පිළිවෙලින් 1971 මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වෙනිදායින් අවසන් වන අයුරු සමාන කොටස් හතරකින් ගෙවිය හැක.

ලලිත් හෙට්ටිආරච්චි,
විශේෂ කොමසාරිස්, දර්ගා නගරය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
දර්ගා නගරය.
1970 සැප්තැම්බර් මස 25 වෙනි දින.

10-909—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## හලාවත පලාත් ආණ්ඩු සභාව

**රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද—1971**

පලාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වැනි පරිච්ඡේදයේ අංක 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය අනුව 1971 අවුරුද්දට රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බවද එම පනතේ අංක 163 (3) යටතේ එම බදු 1971 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දන්වා සිටිමි.

එල්. ජී. ඊ. වික්‍රමසේකර,
විශේෂ කොමසාරිස්,
හලාවත නගරය.

1970.10.10,
හලාවත නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, ට්‍රැක්කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත්කරත්ත, ජින්රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර වෙන ඕනෑම රථයකට ... ... | 5 | 0 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට— | | |
| (වෙළඳ කාර්යයන් සඳහා පාවිච්චි කරන්නේ නම්) ... ... | 3 | 0 |
| (වෙළඳ කාර්යයන් සඳහා නොවන ඕනෑම කාර්යයකට) ... ... | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බරකරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... | 3 | 0 |
| ඕනෑම අන්දමක තනිගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... ... | 3 | 0 |
| ඕනෑම අන්දමක අත්කරත්තයක් වෙනුවෙන් ... | 3 | 0 |
| ජින් රික්ෂෝවකින් ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... ... | 2 | 50 |

10-907/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## හලාවත පලාත් ආණ්ඩු සභාව

**1971 සුනඛ බද්ද**

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනතේ 477 වන පරිච්ඡේදයේ 4 වන ඡේදය යටතේ හලාවත පලාත් ආණ්ඩු සභා සීමාව තුල තබා ගන්නා බල්ලෙකුගෙන්, රු. 1 ක්ද, බැල්ලකගෙන් රු. 2 ක්ද, අය කරන බවද, එම බද්ද 1971 මාර්තු 31 වන දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දන්වමි.

එල්. ජී. ඊ. වික්‍රමසේකර,
විශේෂ කොමසාරිස්,
හලාවත නගරය.

1970.10.10,
හලාවත නගරයේ
විශේෂ කොමසාරිස් කාර්යාලයේ දී ය.

10-907/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## පුස්සැල්ලාව සුළු නගර සභාව

**1971 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු**

**සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරය) 4 වැනි වගන්තිය ප්‍රකාර, පුස්සැල්ලාව සුළු නගර සභාවේ පාලන සීමාව තුළ ඇති කරනු ලබන සෑම බල්ලෙකු වෙනුවෙන් රු. 1 ක් ද, බැල්ලියක් වෙනුවෙන් රු. 1.50ක් ද, 1971 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1971 වර්ෂයට පනවා ඇති බව තත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

පී. පලනිසාමි.
පුස්සැල්ලාව සුළු නගර සභාවේ සභාපති.

1970.10.15,
පුස්සැල්ලාව සුළු නගර සභා කාර්යාලයේ දී.

10–899—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## නාවලපිටිය නගර සභාව

**1971 වර්ෂය සඳහා සුනඛ බද්ද**

සුනඛයින් ලියා පදිංචි කිරීමේ ආඥා පනතේ 477 වැනි පරිච්ඡේදයේ 4 වැනි ඡේදය යටතේ නාවලපිටිය නගර සභා සීමාව තුල තබා ගන්නා බල්ලෙකුගෙන් හෝ බැල්ලියකගෙන් 1971 වර්ෂය සඳහා රු. 1 ක වාර්ෂික ලේබන ගත කිරීමේ ගාස්තුවක් අය කරන බවද, එම බද්ද 1971 මාර්තු 31 වෙනි දිනට පෙර ගෙවිය යුතු බවද, මෙයින් දැනුම් දෙමි.

ඇම්. ඇස්. ගලප්පත්ති,
නාවලපිටිය නගර සභාවේ සභාපති.

1970.10.12 වෙනි දින,
නාවලපිටිය නගර සභා කාර්යාලයේදීය.

10–915/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## නාවලපිටිය නගර සභාව

**1971 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද**

නගර සභා ආඥාපනතේ (255 වැනි අධිකාරියේ) 162 දරණ වගන්තිය යටතේ නාවලපිටිය නගර සභාව විසින් පහත සඳහන් උප ලේඛනය අනුව 1971 අවුරුද්දේ රථ වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බවද, එම පණතේ අංක 163 (3) වගන්තිය යටතේ එම බදු 1971 මාර්තු මස 31 වෙනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| 1. මෝටර් කාර්, රෝදතුනේ මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් සයිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් සඳහා ... ... | 5.00 |
| (2) බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් කරත්තයක් හෝ කාරයක් හෝ රෝද තුනේ බයිසිකල් කරත්තයක හෝ කාරයක්.— | |
| (අ) වෙළඳාම සඳහා යොදනු ලැබේ නම් ... | 3.00 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දැයකට යොදනු ලැබේ නම් ... ... | 1.00 |
| (3) ගොන් දෙන්නා බැඳි කරත්තයක් හෝ තිරික්කල යක් සඳහා ... ... | 5.00 |
| (4) තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 3.00 |
| (5) අත් කරත්තයක් සඳහා ... ... | 2.50 |
| (6) අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙක් සඳහා ... | 5.00 |

ඇම්. ඇස්. ගලප්පත්ති,
නාවලපිටිය නගර සභාවේ සභාපති.

1970.10.12 වෙනි දින,
නාවලපිටිය නගර සභා කාර්යාලයේදීය.

10–915/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට නගර සභාව

**1971 සුනඛ බද්ද**

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වෙනි පරිච්ඡේදයේ) 4 වැනි ඡේදය යටතේ හම්බන්තොට නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලකුගෙන් රු. 2.00 ක්ද සෑම බැල්ලියකගෙන් රු. 3.00 ක්ද, අයකරන බවත්, එම බද්ද 1971 අප්‍රේල් මස 1 වෙනි දිනට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දනුම් දෙමි.

ඇම්. ආර්. තාසිම්,
සභාපති,
නගර සභාව, හම්බන්තොට.

1970 ඔක්තෝබර් මස 4 වැනි දින,
හම්බන්තොට නගර සභා කාර්‍යාලයේ දී ය.

10–910/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## හම්බන්තොට නගර සභාව—නගර සභා ආඥාපනත

**1971 වර්ෂයට දේපල බද්ද**

255 වැනි අධිකාරය වන නගර සභා ආඥාපනතේ 160 වැනි වගන්තිය යටතේ මෙහි පහත සඳහන් ''අ'' උපලේඛනයෙහි විස්තර වන නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට පහක වරිපණම් බද්දක් ද, හම්බන්තොට නගර සභා සීමාව තුළ පිහිටි අනෙකුත් සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට දහයක වරිපණම් බද්දක්ද, යන වශයෙන් මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 යන දිනවලින් අවසාන වන කාර්තු සතරකින් ගෙවිය හැකි වන පරිදි හම්බන්තොට නගර සභාව විසින් පනවා ඇති බවත්, එය පසුගිය වර්ෂයේ බල පැවැත්වූ බද්ද හා සමාන බවත් මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ආර්. තාසිම,
සභාපති,
නගර සභාව, හම්බන්තොට.

1970 ඔක්තෝබර් මස 4 වැනි දින,
හම්බන්තොට නගර සභා කාර්‍යාලයේ දී ය.

### ''අ'' උපලේඛනය

**පහත සඳහන් අංක දරන දේපල**

ටිම්බර් ඩිපෝ පාර.—7/1, 7/2, 7/3, 7/4, 7/5, 7/6, 7/7, 7/8, 7/9, 7/10, 7/11, 7/12, 7/13, 7/14, 7/15, 7/16, 7/17, 7/18, 7/19 හා 7/20.

10–910/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## හම්බන්තොට නගරසභාව

### වාහන හා සත්ව බද්ද—1971

නගර සභා ආඥපනතේ 255 වෙනි පරිච්ඡේදයේ අංක 162 වන වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය අනුව 1971 අවුරුද්දට වාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බවද, එම පනතේ අංක 163 (3) යටතේ එම බදු 1971 මාර්තු 31 වන දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දන්වා සිටිමි.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| 1. මෝටර් රථ, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත්කරත්ත, ජින්රික්ෂෝ කරත්ත, බයිසිකල් සහ රෝදතුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් ... ... | 5 | 0 |
| 2. බයිසිකලයක්, රෝදතුනේ බයිසිකලයක්, බයිසිකල් මෝටර් රථයක් හෝ කරත්තයක්, රෝදතුනේ මෝටර් රථයක් හෝ කරත්තයක් :— | | |
| (අ) වෙළඳ කටයුතු සඳහා යොදනු ලැබේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දේකට යොදනු ලැබේ නම් ... | 1 | 0 |
| 3. ගොන් දෙන්නා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... | 4 | 0 |
| 4. තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් ... | 2 | 0 |
| 5. අත් කරත්තයක් ... ... ... | 2 | 0 |
| 6. ජින් රික්ෂෝ රථයක් ... ... ... | 2 | 50 |
| 7. අශ්වයෙක් හෝ පෝනියෙක් හෝ කොටළුවෙක් ... | 5 | 0 |
| 8. ගොනෙක් හෝ බූරුවෙක් ... ... ... | 0 | 25 |

ඇම්. ආර්. තාසීම්,
සභාපති, නගර සභාව, හම්බන්තොට.

1970 ඔක්තෝබර් මස 4 වැනි දින,
හම්බන්තොට නගර සභා කායර්‍යාලයේ දී ය.

10–910/3—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1971 සඳහාවූ දේපල වරිපණම් බද්ද

(256 වන අධිකාරය වන) සුළු නගර සභා ආඥපනතෙහි 159 (I) වැනි වගන්තිය යටතේ සහ ඒ ඒ වගන්තියෙන් පළාත් පාලන ඇමතිවරයා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර ඔහු විසින් දෙන ලද අනුමැතිය ඇතිව සභාව විසින් නියම කළ හැකි සීමා කිරීම් විශේෂ යෙන් හා කොන්දේසිවලට යටත්ව පොළොන්නරුව නගර සීමාව තුළ පිහිටා තිබෙන (කුඹුරු ඉඩම් හැර) සියළුම නිශ්චල දේපල වල වාර්ෂික වටිනාකමින් සියයට හය (6%) බැගින් වූ වරිපණම් බද්දක් පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 යන දිනයන්හි අවසන් වන තුන් මාස කාලසීමා සඳහා සමාන කොටස් හතරකින් ඒ දිනයන්හි ගෙවිය හැකි පරිදි 1971 වර්ෂය සඳහා පොළොන්නරුව සුළු නගර සභාව විසින් පනවනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

පූ. ලී. බෞද්ධසාර,
සභාපති,
පොළොන්නරුව සුළු නගර සභාව.

1970 10.13 වන දින,
පොළොන්නරුව සුළු නගර සභා කාර්යාලයේදීය.

10–903/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව සුළු නගර සභාව

### 1971 වර්ෂයේ සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥපනත (477 වන අධිකාරය)

477 වන අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, පොළොන්නරුව සුළු නගර සභා බල මණ්ඩලය තුළ තබා ගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා ශත 50 බැගින්ද, ගෑනු සුනඛයෙක් සඳහා ශත 75 බැගින්ද, 1971 මාර්තු 31 හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1971 වර්ෂයට අය කිරීමට පනවා ඇති බව නත් නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

පූ. ලී. බෞද්ධසාර,
සභාපති.
**පොළොන්නරුව සුළු නගර සභාව.**

1970 ක්වූ ඔක්තෝබර් මස 13 වන දින,
පොළොන්නරුව සුළු නගර සභා කාර්යාලයේදීය.

10–903/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## පොළොන්නරුව සුළු නගර සභාව

### 1971 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥපනත

පොළොන්නරුව සුළු නගර සභාව මගින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 (1) දරණ වගන්තිය යටතේ පහත සඳහන් උප ලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1971 අවුරුද්දට රථ වාහන හා සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥාපනතේ 162(3) වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු 31 දාට හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින්ද වේ.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, ලොරි, මෝටර් පා පැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පා පැදි හෝ රෝදත්‍රයේ පා පැදි හැර වෙන ඕනෑම අන්දමේ වාහනයක් සඳහා ... ... ... | 5 | 0 |
| සෑම පා පැදියක්, රෝදත්‍රයේ පා පැදියක් හෝ පා පැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පා පැදි මෝටර් රථයක් හෝ කරත්තයක් :— | | |
| (අ) වෙළඳාම පිණිස පාවිච්චි කරන්නේ නම් ... | 5 | 0 |
| (ආ) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 1 | 0 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බැඳි බර කරත්තයක් සඳහා | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා | 4 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම ජින් රික්ෂෝ රථයක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ අශ්වතරයෙක් සඳහා ... | 1 | 0 |
| සෑම ගොනෙක් හෝ බූරුවෙක් සඳහා ... ... | 1 | 0 |

පූ. ලී. බෞද්ධසාර,
සභාපති,
පොළොන්නරුව සුළු නගර සභාව.

1970 ක්වූ ඔක්තෝබර් මස 13 වැනි දින,
පොළොන්නරුව සුළු නගර සභා කාර්යාලයේදීය.

10–903/3—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## මරකාගොඩ පළාත ගම්සභාව

### ජල භීතිකා රෝගය

මරකාගොඩ පළාත ගම්සභා සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින්, එම ගම්සභා සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩ නැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක, නොවත්නාවූ අන්‍ය ස්ථානයක හෝ පාරක හමුවන දඩාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දා වූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසිම සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (476 වන අධිකාරය වන) ජල භීතිකා ආඥපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම් දෙමි.

මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවන දින සිට හය මාසයක් ගතවන තුරු වලංගු වන්නේ ය.

හමර්න් කන්නන්ගර,
සභාපති,
මරකාගොඩ පළාත ගම්සභාව.

1970 ඔක්තෝබර් මස 12 වන දින,
මරකාගොඩ පළාත ගම්සභාව,
මරකාගොඩ.

10-898—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## නුවරඑළිය දිස්ත්‍රික්කයේ තලවාකැලේ ලිඳුල නගර සභාවේ සීමා වෙනස් කිරීම හා කොට්ඨාශ බෙදීම සම්බන්ධවයි

1. (අ) දැනට තලවාකැලේ ලිඳුල නගර සභාවේ සීමා වලින් පිටස්තරව ඇති යම්කිසි ප්‍රදේශයක් එම නගර සභා සීමාව තුලට ඒකාබද්ධ කළ යුතුද ?

(අ) සභිකයකු නියෝජනය කරන එක් එක් ඡන්ද කොට්ඨාශයේ ඡන්ද සංඛ්‍යාව හැකිතාක් දුරට සමාන වනසේ, ප්‍රදේශයේ විශාලත්වය, ජනගහනය හා වෙනත් හේතු සාධකද සලකා බලා තලවාකැලේ ලිඳුල නගර සභාව සමන්විත විය යුතු සභික සංඛ්‍යාව,

(ඇ) නගර සභාවේ සීමාවල විස්තර සහ

(ඇ) නගර සභාවේ එක් එක් ඡන්ද කොට්ඨාශයේ සීමාවල විස්තර සම්බන්ධ කරුණු ගැන පරීක්ෂාකර වාර්තා කිරීම පිණිස ගරු රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් පහත සඳහන් නියෝජිතයින්ගෙන් සැදුම්ලද කමිටුවක් පත් කර තිබේ :—

(1) නුවරඑළිය කොට්ඨාශයේ පළාත් පාලන සහකාර කොමසාරිස්, ඇල්. ජී. සිරිවර්ධන මහතා.

(2) නුවරඑළිය ප්‍රාදේශීය ආදායම් නිලධාරි, ඒ. එම්. එම්. ෂවුකත් මහතා.

(3) නුවරඑළිය, වලපනේ මැනුම් කණ්ඩායම් භාර නිලධාරි, ඒ. ඇල්. ඇස්. කොබේවත්ත මහතා.

2 මෙම කරුණු සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වන මහජනයා හෝ ආයතන විසින් ඔවුන්ගේ අදහස් පිටපත් 3 කින් යුතුව පහත සඳහන් ලිපිනයට සති දෙකක් ඇතුලතදී එවිය යුතු බැව් මෙයින් දන්වා සිටිමි.

එල්. ජී. සිරිවර්ධන,
සභාපති,
තලවාකැලේ-ලිඳුල නගර සභා සීමා
වෙනස්කිරීම පරීක්ෂාකිරීමේ නිලකමිටුව.

පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය,
නුවරඑළිය, 1970.10.15.

10-887—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### 1971 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥපනත (256 වැනි අධිකාරය වන) යටතේ ගනුවීගෙන යන 1970 වර්ෂයේ බල පවත්නා පහත සඳහන් දේපල බදු 1971 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට ගලේවෙල සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදාසින්, ජූනි 30 වැනිදාසින්, සැප්තැම්බර් 30 වැනිදාසින් සහ දෙසැම්බර් 31 වැනිදසින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඩ. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 8 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

10-901/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## ගලේවෙල සුළු නගර සභාව

### 1971 වර්ෂයට රථවාහන සහ සතුන් පිළිබඳ බද්ද

### සුළු නගර සභා ආඥපනත (256 වැනි අධිකාරය)

ගලේවෙල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ—

(1) සුළු නගර සභා ආඥපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත දැක්වෙන උපලේඛනයෙන් විස්තර වන ගණන් අනුව 1971 වැනි වර්ෂයට රථවාහන සහ සතුන් සඳහා බද්දක් පනවා අය කිරීමටද,

(2) එකී ආඥපනතේ අංක 162(3) වැනි වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගෙවිය හැකි අයුරින්ද වේ.

ඩ. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 8 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙනයම් ඕනෑම වාහනයක් සඳහා ... ... | 5 | 0 |
| හැම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නොහොත් රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (ඒ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 2 | 50 |
| (බී) වෙළඳාමට හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 0 |
| ගොන් දෙන්නා බැඳි සෑම කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 4 | 0 |
| තනි ගොනා බැඳි සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... | 3 | 0 |
| සෑම අත්කරත්තයක් සඳහා ... ... | 3 | 0 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක් හෝ කොටළුවෙකුට ... | 5 | 0 |
| සෑම බූරුවෙකුට හෝ ගොනෙකුට ... ... | 1 | 0 |

10-901/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## ගලේවෙල සුළු නගර සභාව

### 1971 වර්ෂයට සුනඛ බදු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (477 වැනි අධිකාරය)

477 වැනි අධිකාරය වන සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 4 වැනි වගන්තියේ ප්‍රකාර, ගලේවෙල සුළු නගර සභා බල මණ්ඩලය තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1 බැගින් ද, ගෑනු සුනඛයෙක් සඳහා රු. 1.50 බැගින් ද, 1971 මාර්තු මස 31 වැනි දිනට හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තු වක් 1971 වැනි වර්ෂයට අය කිරීමට පනවා ඇති බව ගලේවෙල සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ළ. ජ. ද සිල්වා වික්‍රමසූරිය,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 8 වැනි දින,
ගලේවෙල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

10–901/3—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## කොලොන්නාව නගර සභාව

### ජලභීතිකා රෝගය

කොලොන්නාව නගර සභා සීමාව තුළ ජලභීතිකා උවදුර පවතින බැවින් මෙම නගර සභා සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬවාහෝ යන නැතහොත් බැඳ නොතබන ලද්දාවූ හෝ දක්කා ගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වෙනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥාපනතේ II වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1970 ඔක්තෝබර් 1 වෙනි දින සිට මාස හයක් ඉදිරියට වලංගු වන්නේ ය.

නලගෙදරගේ සෝමසිරි,
සභාපති,
කොලොන්නාව නගර සභාව.

1970 ඔක්තෝබර් මස 5 වෙනි දින,
කොලොන්නාව නගර සභා කාර්යාලය,
වැල්ලම්පිටිය.

10–682—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## හොරණ නගර සභාව

### නගර සභා ආඥාපනත (255 වෙනි පරිච්ඡේදය)

(255 වෙනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 162 (1) වී සහ 164 වෙනි වගන්තිය යටතේ හොරණ නගර සභාව විසින්, මෙහි පහත "ආ" උපලේඛනයේ විස්තර වන 1959.9.11 වෙනි දින අංක 11,852 දරණ ගැසට් පත්‍රයේ හා 1967.9.29 වෙනි දින අංක 14,768 දරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ බලපත්‍ර වෙනුවෙන් මෙතෙක් අය කරනු ලැබූ බලපත්‍ර ගාස්තු වෙනුවට, එකී උපලේඛනයේ සඳහන් බලපත්‍ර ගාස්තු 1971.1.1 දින සිට බලපවත්වන ලෙස පනවා ඇත.

ඩබ්ලිව්. ඇම්. පොන්සේකා,
සභාපති,
හොරණ නගර සභාව.

1970 ඔක්තෝබර් මස 12 වෙනි දින,
නගර සභා කායඝාලයය,
හොරණ.

### "ආ" උපලේඛනය

| බල පත්‍රයේ ස්වභාවය | | බල පත්‍ර ගාස්තුව |
|---|---|---|
| | | රු. ශ. |
| 1. බේකරියක් පවත්වාගෙන යාම | ... | 50 0 |
| 2. තේ සහ/හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම ... ... | ... | 7 50 |
| 3. තේ කඩයක් සහ/හෝ ආපන ශාලාවක් පවත්වාගෙන යාම ... | ... | 25 0 |
| 4. නේවාසිකාගාර රහිත හෝටලයක් පවත්වාගෙන යාම (භෝජන ශාලාවද ඇතුලත්ව) | ... | 50 0 |
| 5. නේවාසිකාගාර සහිත හෝටලයක් පවත්වාගෙන යාම (භෝජන ශාලාවද ඇතුලත්ව) | ... | 75 0 |
| 6. නේවාසිකාගාරයක් පවත්වාගෙන යාම | ... | 25 0 |

10–889—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

### 1971 සුනඛ බද්ද

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වන පරිච්ඡේදයේ 4 වන ඡේදය යටතේ නාවලපිටිය පළාත් ආණ්ඩු සභා සීමාව තුළ තබාගන්නා බල්ලෙකුගෙන් රු. 1.25 ක්ද, බැල්ලකගෙන් රු. 2.50 ක්ද, අයකරන බවද, එම බද්ද 1971 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

එච්. එම්. එල්. බදූර්දීන්,
සභාපති,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව.

1970 ඔක්තෝබර් මස 15 වැනි දින,
නාවලපිටිය,
පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දී ය.

10–900/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

### 1971 වාහන බද්ද හා සත්ව බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 255 වැනි පරිච්ඡේදයේ අංක 162 දරණ වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනය අනුව 1971 අවුරුද්දට වාහන සහ සතුන් පිළිබඳ බද්දක් පනවා ඇති බවද, එම පනතේ අංක 163 (3) යටතේ එම බදු 1971 මාර්තු මස 31 වැනි දිනට පෙර ගෙවිය යුතු බවද මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| | | | රු. ශ. |
|---|---|---|---|
| 1. මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත්කරත්ත, ජින් රික්ෂෝ කරත්ත, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර ඕනෑම රථයක් | ... | ... | 5 0 |
| 2. බයිසිකලයක්, රෝද තුනේ බයිසිකලයක්, බයිසිකල් රථයක් හෝ කරත්තයක් හෝ රෝද තුනේ බයිසිකල් රථයක් හෝ කරත්තයක්— | | | |
| (අ) වෙළඳාම සඳහා යෝදනු ලැබේ නම් | | ... | 5 0 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් දැයකට යොදනු ලැබේ නම් | ... | ... | 1 0 |
| 3. ගොන් දෙන්නා හෝ තනි ගොනා බැඳි කරත්තයක් හෝ තිරික්කලයක් | ... | ... | 3 0 |
| 4. අත්කරත්තයක් | ... | ... | 2 0 |
| 5. ජින් රික්ෂෝ රථයක් | ... | ... | 1 50 |
| 6. අශ්වයෙක්, පෝනියෙක්, කොටළුවෙක් | | ... | 3 0 |
| 7. ගොනෙක් හෝ බූරුවෙක් | ... | ... | 1 0 |

එච්. එම්. එල්. බදූර්දීන්,
සභාපති,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව.

1970 ඔක්තෝබර් මස 15 වැනි දින,
නාවලපිටිය,
පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දී ය.

10–900/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### 1971 වර්ෂයට දේපළ බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 අධිකාරය) යටතේ ගතවී යන 1970 වර්ෂයට බලපවත්නා පහත සඳහන් වරිපනම් බදු 1971 වර්ෂයටද එලෙසම පැනවීමට බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

159 වන වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන කුඹුරු හැර අන් සියළුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට පහ බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31, ජූනි 30, සැප්තැම්බර් 30 සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අසුරු කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඩී. පී. විජේසිංහ,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

1970 ඔක්තෝබර් මස 15 වන දින,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා කාර්යාලයේදීය.

10–902/1—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### 1971 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපණත

බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත් කරණු ලබන්නේ —

(1) 256 වැනි අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 වගන්තිය අනුව පහත සඳහන් උපලේඛනයේ විස්තර වන ගණන් අනුව, 1971 වර්ෂයට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා ඇති බවත්,

(2) එකී ආඥාපනතේ 162 (3) වැනි වගන්තිය යටතේ එකී බදු 1971 මාර්තු මස 31 වැනිදා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| සෑම පාපැදියක් සඳහා ... ... ... | 1 | 0 |
| සෑම අත් කරත්තයක් සඳහා ... ... | 1 | 50 |
| ගොන් දෙන්නා බඳින සෑම බරකරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... ... ... | 3 | 0 |
| තනි ගොනා බඳින සෑම බරබාගයක් හෝ තිරික්කලයක් සඳහා | 2 | 0 |
| සෑම ගොනෙකු සඳහා ... ... ... | 1 | 0 |

ඩී. පී. විජේසිංහ,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

1970. 10. 15 වැනි දින,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා කායසීලයේදීය,
බත්තරමුල්ල.

10–902/2—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව

### 1971 වර්ෂයට සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපණත (477 වැනි පරිච්ඡේදය)

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වැනි පරිච්ඡේදයේ 4 වැනි කොටසේ ප්‍රකාර බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා සීමාව තුළ තබා ගන්නා සෑම බල්ලෙක් වෙනුවෙන්ම රු. 1 ක් ද, බැල්ලක් වෙනුවෙන් රු. 1.50 ක් ද ලියාපදිංචි කිරීමේ ගාස්තු වශයෙන් 1970 වර්ෂයේදී මෙන්ම 1971 වර්ෂයේදී ද පනවා ඇති බවත්, එකී ගාස්තු 1971 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

ඩී. පී. විජේසිංහ,
සභාපති,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභාව.

1970. 10. 15 වැනි දින,
බත්තරමුල්ල-තලන්ගම සුළු නගර සභා කායසීලයේදීය,
බත්තරමුල්ල.

10–902/3—70.10.23 දින අංක 14,929 දරන ගැසට් පත්‍රය

---

## බිංගිරිය ගම්සභාව

### ගම්සභා ආඥාපනත (27) වැනි පරිච්ඡේදය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ගම්සභාව විසින් 1970 ජූලි මස 29 වැනි දින පැවැත්වූ මාසික මහ සභා රැස්වීමේදී ඒකච්ඡන්දයෙන් සහා සම්මත කරගන්නා ලද මෙහි පහත සඳහන් යෝජනාව මහජනයාගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කරනු ලැබේ. යෝජිත කරුණු සම්බන්ධයෙන් ඉඩම් හිමියන් හෝ ප්‍රදේශවාසී මහජනතාව විරුද්ධ වන්නේ නම්, එසේ විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසා යයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුලත මා වෙත එවීමට බලය තිබෙන බවත්, මෙකී කාලය තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුවහොත් ඉන්පසු එම පාරවල් ගම්සභාව සතු දේපලක් හැටියට සලකා පාලනය කරනු ලබන බවත්, මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

බිංගිරිය ගම්සභා කාර්යාලය.
බිංගිරිය, 1970.8.3.

කේ. පී. ඒ. මාළනාව,
බිංගිරිය ගම්සභාවේ සභාපති.

### යෝජනාව

1952 අංක 6 දරණ ප්‍රදේශාධිකාරි පොදු අතුරු ව්‍යවස්ථා ආඥාපණතේ 3 වැනි වගන්තියේ 1 වැනි උප වගන්තිය යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ බිංගිරිය ප්‍රදේශයේ ගම්සභාව විසින් 1954 ඔක්තෝබර් මස 29 වැනි දින සහ අංක 10,729 දරණ ලංකාණ්ඩුවේ ගැසට්පත්‍රයේ IV වැනි කොටසේ පළකරන ලද යෝජනාවෙන් සම්මත කරන ලද පොදු අතුරු ව්‍යවස්ථාවල 4 වැනි කාණ්ඩයේ 1 වැනි අතුරු ව්‍යවස්ථාව ප්‍රකාර මෙහි පහත සඳහන් මංමාවත් එකිනෙක ඉදිරියේ සඳහන් දිග, පළල අනුව සාද හෝ නැවත සාද පවත්වාගෙන යනු ලබන බවත්, ඉහත සඳහන් අතුරු ව්‍යවස්ථාවල 6 වැනි අතුරු ව්‍යවස්ථාව යටතේ එකී මංමාවත් වල බිංගිරිය ගම්ප්‍රදේශයේ ගම්සභාවේ සභාපති තුමාගෙන් ලියවිල්ලකින් ලබාගත් අවසරයක් නොමැතිව මුළු බර ටොන් එකහමාරකට වැඩි ලොරි, බස්, වෑන් සහ ට්‍රැක්ටර් රථ ගමනා ගමනය තහනම් කිරීමත් මෙයින් තීරණය කරනු ලැබේ යන යෝජනාව අයි. ඇම්. සේනානායක මහතා ගෙන එන ලදුව ඒ. ඇම්. ගුණතිලක මහතාගේ ස්ථිරත්වයෙන් ඒකමතිව සහා සම්මතවිය.

#### ඉහත සඳහන් මංමාවත්

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| | **කොට්ඨාශ අංක 1—කුඩකොළව** | | |
| 1 | කුඩකොළව පංසල ලඟින් පටන්ගෙන හබවැවේ මහ පාරදක්වා ගම්සභා පාර | 11,660 | 24 |
| 2 | හබවැවේ මහපාරෙන් පටන්ගෙන ගණේගොඩ හංදිය දක්වා පාර | 1,962 | 21 |
| 3 | නිතලව සිට රත්මලේ දක්වා පාර | 13,230 | 24 |
| 4 | නිතලව ගම්සභා පාරේ සිට මිනිපිටිය දක්වා පාර | 1,560 | 27 |
| 5 | නිතලව සිට ගණේගොඩ ගම්සභා පාර දක්වා පාර | 1,800 | 27 |
| 6 | ගණේගොඩ සිට තාරණ දක්වා පාර | 3,920 | 21 |
| 7 | නිතලව සිට මූකලාන දක්වා පාර | 5,244 | 18 |
| 8 | කොස්වත්තේ සිට මූකලාන හරහා තාරණට පාර | 1,284 | 27 |
| 9 | කුඩකොළව ගම්සභා පාරෙන් පටන්ගෙන කිවුලඅගාරේ වදුරැස්සට පාර | 3,960 | 8 |
| 10 | කුඩකොළව වදුරැස්ස පාරේ සිට වැව දක්වා පාර | 3,000 | 30 |
| 11 | කුඩකොළව සිට හංතිහව දක්වා පාර | 846 | 27 |

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 12 | නිතලව සිට කොස්වත්ත දක්වා පාර | 312 | 18 |
| 13 | නිතලව සිට කොන්ගහකුඹුර දක්වා පාර | 2,100 | 18 |
| 14 | හලාවත කුරුණෑගල පාරේ සිට මැදවැවගාව වත්ත දක්වා පාර | 441 | 9 |
| 15 | හල්මිල්ලවැව ගම්සභා පාරේ සිට හල්මිල්ලවැව පහළ ගංගොඩ දක්වා පාර | 1,074 | 9 |
| 16 | හල්මිල්ලවැවේ ගම්සභා පාරේ සිට හල්මිල්ලවැව ඉහළ ගංගොඩ දක්වා පාර | 879 | 9 |
| 17 | හලාවත කුරුණෑගල පාරේ සිට කපුහේන දක්වා පාර | 1,670 | 9 |
| 18 | රත්මලේ-ගණේගොඩ ගම්සභා පාරේ සිට උස්වැව ගම්සීමාව දක්වා පාර | 1,820 | 18 |
| 19 | ගණේගොඩ තාරණ ගම්සභා පාරේ සිට උස්වැව ගම් මායිම දක්වා පාර | 980 | 12 |
| 20 | ගණේගොඩ උස්වැව ගම්සභා පාරේ සිට තාරණ ගම්සභා පාරේ වෑකන්ද දක්වා | 720 | 8 |
| 21 | හබවැව මාකොළව පාරෙන් පටන්ගෙන වැටියගෙදර දක්වා පාර | 2,470 | 8 |
| 22 | කොස්වත්ත රත්මලේ පාරේ සිට ඉහළවෙල කුඹුරු යාය දක්වා පාර | 428 | 8 |

## කොට්ඨාශ අංක 2—හෙණ්ඩියපොල

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1 | හෙණ්ඩියපොල ගම්සභා පාරේ සිට බ්‍රහ්මණයාගම මිනිපිටිය දක්වා පාර | 762 | 18 |
| 2 | අනුමැතියාගම ගම්සභා පාරේ සිට කොස්වත්ත කඩිගාව පාර දක්වා පාර | 6,681 | 22 |
| 3 | අනුමැතියාගම ගම්සභා පාරෙන් පටන්ගෙන පහළ මලත්තව වත්තෙන්ගොස් වෙල දක්වා පාර | 822 | 18 |
| 4 | කොස්වත්ත කොළමුණුඔයෙන් පටන්ගෙන වීරපොකුණ දක්වා පාර | 4,905 | 30 |
| 5 | තරඳණයාගම වීරපොකුණ මහපාරෙන් පටන්ගෙන කොළමුණුඔය දක්වා පාර | 4,441 | 18 |
| 6 | බෝවත්ත වීරපොකුණ මහපාරේ කරඳණයාගමෙන් පටන්ගෙන දියකෙළියාව වැව දක්වා පාර | 6,585 | 22 |
| 7 | බෝවත්ත වීරපොකුණ පාරේ හිරිපොකුණ හංදියේ සිට කොළමුණු ඔය දක්වා | 6,400 | 25 |
| 8 | බෝවත්ත වීරපොකුණ පාරේ පහළ කරඹේ හංදියේ සිට කරුවලගහමුල මිනිපිටිය දක්වා පාර | 132 | 15 |
| 9 | බෝවත්ත වීරපොකුණ මහපාරේ පහළ කරඹේ හංදියේ සිට කරඳ පොතාන දක්වා පාර | 4,107 | 22 |
| 10 | ඉහළ කරඹේ සිට ඔලුපැලියාව දක්වා පාර | 588 | 12 |
| 11 | ඉහළ කරඹේ සිට අළුත් ගම දක්වා පාර | 1,200 | 18 |

## කොට්ඨාශ අංක 3—මාණෙලෙම්බුව

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1 | බෝවත්ත දඳුරුඔය මහපාරේ වීරපොකුණේ සිට බොරළු වැව දක්වා පාර | 26,925 | 18 |
| 2 | වීරපොකුණ අළුත්ගම පාරේ සිට යකදුරුකටුව පොදු හේන්යාය දක්වා පාර | 903 | 22 |
| 3 | බෝවත්ත දඳුරුඔය පාරේ වීරපොකුණේ සිට වීරපොකුණ ගම මැදින් අළුත් ගමට පාර | 2,220 | 24 |
| 4 | බොරළු වැව පාරේ සිට කිණියම මහවැව දක්වා පාර | 1,020 | 22 |
| 5 | අළුත්ගම සිට ගැටුලාව දක්වා පාර | 756 | 22 |
| 6 | වීරපොකුණ ගම්පාරේ සිට යකදුරු කටුව හේන්යායට පාර | 1,758 | 18 |
| 7 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට හඩුපිටිය පාර | 2,264 | 24 |
| 8 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට ඉහළ ගොඩකන්දවේ මිනිපිටිය පාර | 408 | 12 |
| 9 | වීරපොකුණ බොරළු වැව පාරේ සිට පහළ කෝනකඳවල දක්වා පාර | 3,900 | 24 |
| 10 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට පහළ කිණියම දක්වා පාර | 1,886 | 18 |
| 11 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට කිණියම මහවැවුකන්ද දක්වා පාර | 102 | 12 |
| 12 | බෝවත්ත දඳුරු ඔය පාරේ ඉහළ කිණියම සිට මකුල්ලපොකුණට පාර | 636 | 22 |
| 13 | බෝවත්ත දඳුරුඔය පාරේ ඉහළ කිණියම සිට පුවක්ගහකඩවල පාර | 732 | 22 |
| 14 | හඩුපිටිය පාරේ සිට ඉහළ කිණියම ඇලගාව වත්ත පාර | 240 | 12 |
| 15 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට මාණෙලෙම්බුව හරහා වෙලන්ගොල්ල පාර | 4,383 | 24 |
| 16 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට මාණෙලෙම්බුව පංසල්වත්ත පාර | 474 | 12 |
| 17 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට කොරකහපොකුණ අගාර හරහා කෝන්කඳවල පාර | 6,075 | 24 |
| 18 | මාණෙලෙම්බුව කෝන්කඳවල පාරේ සිට මාණෙලෙම්බුව මිනිපිටිය දක්වා පාර | 225 | 12 |
| 19 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට කොස්ගහගොඩ මිනිපිටිය පාර | 66 | 12 |
| 20 | මාණෙලෙම්බුව කෝන්කඳවල පාරේ සිට අගාරේ මිනිපිටිය පාර | 90 | 12 |
| 21 | බෝවත්ත දඳුරු ඔය පාරේ සිට වීරපොකුණ කුඹුක්ගහවැව පාර | 39 | 12 |
| 22 | වීරපොකුණ බොරළුවැව පාරේ සිට මහදංවිල පාරට | 210 | 12 |
| 23 | ඉහළ කෝන්කඳවල පාරේ සිට පිලපිටිය පාර | 903 | 16 |
| 24 | ඉහළ කෝන්කඳවල පාරේ සිට කොරකහපොකුණ වත්ත පාර | 180 | 12 |
| 25 | මාණෙලෙම්බුව වෙලන් ගොල්ල පාරේ සිට එගොඩපිටිය වෙල්යායටපාර | 680 | 12 |

## කොට්ඨාශ අංක 4—කිණියම

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1 | හඩුපිටියේ සිට ඉහළකිණියමට යන පාර | 3,918 | 22 |
| 2 | පහළ කිණියම සිට ඉහළ වැව දක්වා පාර | 540 | 30 |
| 3 | අගාරේ සිට පහළ කෝන්කඳවල පාර | 4,200 | 27 |
| 4 | ඉහළ තලම්පොල සිට දඳුරු ඔය දක්වා පාර | 7,998 | 28 |
| 5 | ඉහළ කිණියම සිට මඩිගේ වෙල්ලන්ගිරිය පාර | 12,558 | 28 |
| 6 | මකුල්ලපෙකුණ සිට කිරින්දගම හරහා කඩිගාව පාර | 762 | 18 |
| 7 | පහළ තලම්පොල සිට පුවක්ගහකඩවල පාර | 1,230 | 18 |
| 8 | පහළ තලම්පොල සිට පුවක්ගහකඩවල හංදිය පාර | 3,018 | 24 |
| 9 | පහළ තලම්පොල සිට පුවක්ගහකඩවල ගංගොඩ පාර | 840 | 30 |
| 10 | ඉහළ කිණියම සිට පුවක්ගහකඩවල හරහා අළුත්ගම පාර | 6,075 | 30 |
| 11 | ඉහළ කිණියම සිට පහළ කෝන්කඳවල, ආඩිගෙදර හරහා වැල්පොතු වැව පාර | 8,976 | 60 |
| 12 | කෝන්කඳවල සිට ඉහළ කෝන්කඳවල ගංගොඩ දක්වා පාර | 120 | 12 |
| 13 | පහළ කෝන්කඳවල සිට කුඹුක්ගහ වැව පාර | 810 | 12 |
| 14 | කිරින්දේගම සිට පහළ කෝන්කඳවල පාර දක්වා පාර | 2,358 | 30 |

## කොට්ඨාශ අංක 5—ගල්වැව

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1 | කොස්හේනඅගාර හංදියෙන් පටන්ගෙන වෙල්ලන්ගිරිය දක්වා පාර | 42,420 | 30 |
| 2 | තිසෝගම මහ පාරෙන් පටන්ගෙන ගඩොල්වක හරහා දඳුරුඔය පාර | 10,260 | 60 |
| 3 | පහළ ගල්වැව පාරෙන් පටන්ගෙන පහළ මොලඑලිපිටිය දක්වා පාර | 675 | 60 |
| 4 | ඉහළ මොලඑලිපිටිය පාරේ සිට මොලඑලිය හරහා දඳුරු ඔය දක්වා | 19,620 | 30 |
| 5 | මොලඑලිය පාරේ සිට කාරඹු ඔය දක්වා පාර | 5,178 | 30 |
| 6 | මොලඑලිය ගංගොඩ පාරේ සිට මොලඑලිය මහවෙල දක්වා පාර | 1,308 | 30 |
| 7 | ගැටුලාව පාරේ සිට කාරඹු ඔය පාර දක්වා පාර | 6,600 | 30 |
| 8 | ගැටුලාව පාරේ සිට ගැටුලාවේ මහවැව දක්වා පාර | 600 | 15 |
| 9 | ගැටුලාව පාරේ සිට මිනිපිටිය දක්වා පාර | 300 | 15 |
| 10 | සියඹලාවැව වත්තට යන පාරේ සිට වෙලන්කැලේ වත්තට යන පාර දක්වා | 600 | 15 |
| 11 | ගැටුලාව පාරේ සිට සියඹලා වැව වත්ත දක්වා පාර | 2,400 | 18 |

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 12 | ගැටුලාව පාරේ සිට පුවක්ගහකඩවල දක්වා පාර | 2,550 | 24 |
| 13 | තිසෝගම පාරේ සිට තිසෝගම ගංගොඩ දක්වා පාර | 1,260 | 12 |
| 14 | ඉහළ ගල්වැව පාරේ සිට සිරියාහේනයලාගේ ඉඩම දක්වා | 774 | 12 |
| 15 | ඉහළ ගල්වැව පාරේ සිට මොලඑලිය පාර දක්වා පාර | 1,020 | 12 |
| 16 | මොලඑලිය පාරේ සිට ඉහළ මොලඑලිපිටිය ගංගොඩ දක්වා පාර | 1,425 | 12 |
| 17 | පහළ ගල්වැව පාරේ සිට බෝගොඩයාගම වත්තට යන පාර දක්වා | 660 | 12 |
| 18 | ඉහළ ගල්වැව පාරේ සිට ඉහළ රඹෙපිටිය වැව දක්වා පාර | 750 | 12 |
| 19 | මොලඑලිය පාරේ සිට මොලඑලිය ගංගොඩට යන පාර | 759 | 12 |
| 20 | මොලඑලිය පාරේ සිට අස්සැද්දුම දක්වා පාර | 1,095 | 12 |
| 21 | ගැටුලාව පාරේ සිට අළුත්ගම දක්වා පාර | 3,900 | 12 |
| 22 | ගැටුලාවේ වැවට යන පාරේ සිට සියඹලාවැව වත්ත දක්වා පාර | 1,800 | 12 |
| 23 | ගැටුලාව කරත්ත පාරේ සිට කාරඹු ඔය දක්වා පාර | 1,875 | 12 |
| 24 | තිසෝගම ගල්වැව පාරේ සිට රඹෙපිටිය මිනිපිටිය දක්වා පහළ කන්සදළුව වත්ත පාර | 430 | 20 |

### කොට්ඨාශ අංක 6—බ්‍රහ්මණයාගම

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1 | වැලිගම සිට බෙලිඔතේ දක්වා පාර | 2,187 | 22 |
| 2 | හෙණ්ඩියපොල සිට බ්‍රහ්මණයාගම හංදිය දක්වා පාර | 1,968 | 24 |
| 3 | බෙලිඔතේ සිට ලබුයාය දක්වා පාර | 3,774 | 24 |
| 4 | ඔට්ටුපල්ලම සිට මෝරාවිල දක්වා පාර | 3,180 | 22 |
| 5 | මෝරාවිල කොළමුණු ඔයේ සිට ඌරාපොත්ත හංදිය දක්වා පාර | 2,475 | 22 |
| 6 | ඌරාපොත්තේ සිට පහළ මොලඑලිපිටිය දක්වා පාර | 3,660 | 24 |
| 7 | ඌරාපොත්තේ සිට ලබුයාය හංදිය දක්වා පාර | ,3,474 | 24 |
| 8 | ඌරාපොත්තේ සිට දදුරු ඔය වත්ත දක්වා පාර | 2,474 | 22 |
| 9 | පහළ මොලඑලිපිටියේ සිට ගල්වැව පළාත දක්වා පාර | 1,674 | 22 |
| 10 | ලබුයායේ සිට මොරලන්ද වත්ත දක්වා පාර | 2,460 | 22 |
| 11 | ලබුයායේ සිට දියකෙළියාව දක්වා පාර | 8,244 | 24 |
| 12 | නිට්ටඹුගම සිට මරදවිල දක්වා පාර | 4,368 | 18 |
| 13 | නිට්ටඹුගම සිට මිනිපිටිය දක්වා පාර | 570 | 18 |
| 14 | නිට්ටඹුගම සිට ලබුයාය ගම්සභා පාර දක්වා පාර | 4,183 | 20 |
| 15 | බෙලිඔතේ සිට ඔට්ටුපල්ලම දක්වා පාර | 2,700 | 28 |
| 16 | බ්‍රහ්මණයාගම සිට මූකලංහේන දක්වා පාර | 2,880 | 20 |
| 17 | බ්‍රහ්මණයාගම සිට ඔට්ටුපල්ලම දක්වා පාර | 1,830 | 12 |
| 18 | ඌරාපොත්ත ගම්සභා පාරේ සිට ඌරාපොත්ත මොලඑලිපිටිය දක්වා පාර | 2,268 | 18 |
| 19 | ඌරාපොත්ත දදුරුඔය පාරේ සිට දළුපොත කුඹුර දක්වා පාර | 2,790 | 18 |
| 20 | ඌරාපොත්ත දදුරුඔය පාරේ සිට බිංගිරිය පංසල දක්වා පාර | 6,370 | 12 |

### කොට්ඨාශ අංක 7—බිංගිරිය

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1 | හලාවත කුරුණෑගල මහ පාරේ සිට බිංගිරිය පංසල දක්වා පාර | 5,952 | 28 |
| 2 | බිංගිරිය පංසල් පාරේ සිට ගොඩවෙල දක්වා පාර | 1,206 | 20 |
| 3 | බිංගිරිය පහළ වෙලට යන පාරේ සිට මුරුකණ්ඩිය දක්වා පාර | 672 | 12 |
| 4 | බිංගිරිය පහළ වෙලට යන පාරේ සිට දදුරු ඔය පාර දක්වා පාර | 8,016 | 30 |
| 5 | බිංගිරිය පංසල් පාරේ සිට කොළමුණු ඔය දක්වා පාර | 2,736 | 18 |
| 6 | බිංගිරිය පංසලේ සිට කොළමුණුඔය දක්වා පාර | 3,798 | 18 |
| 7 | බිංගිරිය පංසලේ සිට විලත්තව දක්වා පාර | 5,970 | 16 |
| 8 | බිංගිරිය පංසලේ සිට තල්ගහපිටිය දක්වා පාර | 3,240 | 16 |
| 9 | හලාවත කුරුණෑගල මහ පාරේ සිට කොළමුණු ඔය දක්වා පාර | 4,350 | 24 |
| 10 | කොළමුණු ඔය ගම්සභා පාරේ සිට මූකලංහේන දක්වා පාර | 546 | 12 |
| 11 | කොළමුණු ඔය ගම්සභා පාරේ සිට ගොඩවෙල වැව හා වෙලට යන පාර | 1,770 | 12 |
| 12 | හලාවත කුරුණෑගල පාරේ සිට මූකලංහේන දක්වා පාර | 1,710 | 16 |
| 13 | හලාවත කුරුණෑගල පාරේ සිට කණත්තේවැටිය වැවු කොටව දක්වා පාර | 1,320 | 12 |
| 14 | හලාවත කුරුණෑගල පාරේ සිට මූකලංහේන ගංගොඩ දක්වා පාර | 402 | 18 |
| 15 | හල්මිල්ලවැව වැකන්දේ සිට කොළමුණු ඔය දක්වා පාර | 3,162 | 20 |
| 16 | යගම්පත්තු කෝරළයට යන පාරේ සිට මහවැව දක්වා පාර | 228 | 16 |
| 17 | යගම්පත්තු කෝරළේට යන පාරේ සිට දියගිල්ම දක්වා යන පාර | 510 | 12 |
| 18 | යගම්පත්තු කෝරළයට යන පාරේ සිට කරවුවැව වැකන්ද දක්වා පාර | 2,016 | 20 |
| 19 | හලාවත කුරුණෑගල පාරේ සිට මූකලංවෙලට යන පාර | 912 | 18 |
| 20 | හලාවත කුරුණෑගල පාරේ සිට හල්මිල්ලවැවේ වැකන්දට පාර | 270 | 16 |
| 21 | හලාවත කුරුණෑගල පාරේ සිට කුඩාවැව මුරුකණ්ඩිය දක්වා පාර | 360 | 20 |
| 22 | හලාවත කුරුණෑගල පාරේ සිට කළුගමට යන පාර | 1,230 | 20 |
| 23 | හලාවත කුරුණෑගල පාරේ සිට විලත්තව දක්වා යන පාර | 903 | 18 |
| 24 | මුරුකණ්ඩිය කරවුවැව ගම්සභා පාරේ සිට කරවුවැව ජෝසප් වත්ත දක්වා පාර | 970 | 10 |
| 25 | යගම්පත්තු කෝරළයට යන පාරේ සිට කරවුවැව මිනිපිටිය දක්වා පාර | 1,120 | 18 |

### කොට්ඨාශ අංක 8—මාළනාව

| පිළිවෙලේ අංකය | පාරේ නම | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|
| 1 | හලාවත කුරුණෑගල මහ පාරේ කොස්වත්ත සිට වදුරුස්ස හරහා කන්දෙවිය පාර | 3,070 | 60 |
| 2 | කොස්වත්ත හතරමං සංදියේ සිට කොළමුණු ඔය දක්වා පාර | 3,582 | 60 |
| 3 | කොස්වත්ත හතරමං සංදියේ සිට නිතලව දක්වා පංසල් පාර | 1,440 | 30 |
| 4 | කොස්වත්ත මහ පාරේ සිට මහවැව වැකන්ද පාර | 1,358 | 26 |
| 5 | දළුපොත මහ පාරේ සිට දළුපොත ගංගොඩ හරහා මහ පාරට | 3,375 | 18 |
| 6 | මාළනාව මහ පාරේ සිට බෝවත්ත කඩිගාව පාර දක්වා පාර | 5,607 | 26 |
| 7 | බෝවත්ත කඩිගාව පාරේ සිට බෝවත්ත වැව හා කඩයාය හරහා පානවැව දක්වා පාර | 6,438 | 27 |
| 8 | කොස්වත්ත කුලියාපිටිය පාරේ සිට කොස්වත්තහේන්යාය හරහා බෝවත්ත කඩියාගව පාර දක්වා පාර | 6,830 | 24 |
| 9 | කොස්වත්ත කුලියාපිටිය පාරේ සිට නිතලව වත්ත මායිම හරහා ජස්ටින්කටුව හේන්යාය පාර | 4,480 | 22 |
| 10 | කොස්වත්ත කොළමුණු ඔය ගම්සභා පාරේ සිට වදුරුස්ස හරහා කන්දේවිය පාර දක්වා | 11,280 | 24 |
| 11 | හලාවත කුරුණෑගල මහ පාරේ සිට දළුපොත වැවේ වාන දක්වා පාර | 1,554 | 18 |
| 12 | දළුපොත මහ පාරේ සිට ගල්බිඳපු හේන්යාය හා හෙණ්ඩියගම හරහා කොළමුණු ඔය දක්වා පාර | 1,920 | 24 |
| 13 | හලාවත කුරුණෑගල මහ පාරේ පානවැව සිට කරවුවැව හරහා පාර | 6,960 | 24 |
| 14 | හලාවත කුරුණෑගල මහ පාරේ සිට තේක්ක හේන හරහා පානවැව ගම්සභා පාර | 4,240 | 24 |
| 15 | පානවැව ගම්සභා පාරේ සිට කඩයාය දක්වා පාර | 1,520 | 22 |
| 16 | පානවැව ගම්සභා පාරේ සිට කුඹුර මැදින් ගංගොඩ දක්වා පාර | 843 | 18 |
| 17 | කුරුණෑගල හලාවත පාරේ සිට ගම්සභා කාර්යාලය අසලින් ගලගාව හෙන්යාය පාර | 1,650 | 22 |

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

**1970**

| මාසය | | පළ කිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|---|
| ජූනි | ... | 70. 6. 5 සිකුරාද | ... | 70. 5.29 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.11 බ්‍රහස්පතින්ද | ... | 70. 6. 5 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 6.18 බ්‍රහස්පතින්ද | ... | 70. 6.11 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 6.25 බ්‍රහස්පතින්ද | ... | 70. 6.18 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| ජූලි | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | ... | 70. 6.25 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.10 සිකුරාද | ... | 70. 7. 2 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70. 7.17 සිකුරාද | ... | 70. 7.10 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.24 සිකුරාද | ... | 70. 7.17 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70. 7.31 සිකුරාද | ... | 70. 7.24 සිකුරාද | දහවල් | 12.0 |
| අගෝස්තු | ... | 70. 8. 7 සිකුරාද | ... | 70. 7.30 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70. 8.14 සිකුරාද | ... | 70. 8. 7 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.21 සිකුරාද | ... | 70. 8.14 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 8.28 සිකුරාද | ... | 70. 8.21 සිකුරාද | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් | ... | 70. 9. 4 සිකුරාද | ... | 70. 8.28 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.11 සිකුරාද | ... | 70. 9. 4 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.18 සිකුරාද | ... | 70. 9.11 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70. 9.25 සිකුරාද | ... | 70. 9.18 සිකුරාද | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් | ... | 70.10. 2 සිකුරාද | ... | 70. 9.25 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10. 9 සිකුරාද | ... | 70.10. 2 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.16 සිකුරාද | ... | 70.10. 9 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.23 සිකුරාද | ... | 70.10.16 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.10.30 සිකුරාද | ... | 70.10.23 සිකුරාද | ප.ව. | 3.30 |
| නොවැම්බර් | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | ... | 70.10.30 සිකුරාද | ප.ව. | 3.30 |
| | | 70.11.12 බ්‍රහස්පතින්ද | ... | 70.11. 5 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.20 සිකුරාද | ... | 70.11.12 බ්‍රහස්පතින්ද | දහවල් | 12.0 |
| | | 70.11.27 සිකුරාද | ... | 70.11.20 සිකුරාද | දහවල් | 12.0 |
| දෙසැම්බර් | ... | 70.12. 4 සිකුරාද | ... | 70.11.27 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.11 සිකුරාද | ... | 70.12. 4 සිකුරාද | දහවල් | 12.0 |
| | | 70.12.18 සිකුරාද | ... | 70.12.10 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.24 බ්‍රහස්පතින්ද | ... | 70.12.17 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |
| | | 70.12.31 බ්‍රහස්පතින්ද | ... | 70.12.24 බ්‍රහස්පතින්ද | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුව.
කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිගේ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි.